# (ඇ) මූල්‍ය හා බැංකු කටයුතු හැඩගැස්ම

## 1. (අ) මුදල් සැපයුම - ප්‍රධාන උපනතීන්

1971 වර්ෂය තුළදී, මුදල් සැපයුමෙහි කැපී පෙනෙන ප්‍රසාරණයක් දක්නට තිබුණි. මෙම කාලයේදී මුදල් සැපයුම රුපියල් දශ ලක්ෂ 183.1 කින් හෙවත් සියයට 9.3 කින් ඉහළ ගියේය. 1970 වර්ෂයේදී එය රුපියල් දශලක්ෂ 83.5 කින් හෙවත් සියයට 4.5 කින් වැඩිවී තිබිණි. නිරපේක්ෂ සංඛ්‍යාවන් අනුව බලන විට මෙම වැඩිවීම 1950 වර්ෂයට පසුව වාර්තා වූ විශාලතම වැඩිවීමයි. එමෙන්ම එය 1963 වර්ෂයෙන් පසු විශාලතම වැඩිවීමේ අනුපාතිකයද විය. මෙම වර්ෂයේදී මුදල් සැපයුමෙහි මාසික සාමාන්‍ය මට්ටම ඉකුත් වර්ෂයේදී පැවති මට්ටමට වඩා සියයට 6.7 කින් ඉහල් විය.

1971 වර්ෂයේදී මුදල් සැපයුමෙහි වූ ප්‍රසාරණය සම්පූර්ණයෙන්ම ඇති වූයේ, වර්ෂයේ ප්‍රථම භාගයේදීය. ජනවාරි මාසයේදී, රුපියල් දශලක්ෂ 24 ක අඩුවීමකින් පසුව, ජූනි මාසය දක්වා සෑම මාසයකදීම මුදල් සැපයුම සැලකිය යුතු ලෙස වැඩි වූ බව II (ඇ) 1 සංඛ්‍යා සටහනින් පැහැදිලි වෙයි. විශාල වැඩිවීම් වාර්තා වූයේ මාර්තු සහ අප්‍රේල් යන මාසයන්හිදීය. ඒ පිළිවෙලින් රුපියල් දශලක්ෂ 77 කින් සහ රුපියල් දශලක්ෂ 51 කිනි. වර්ෂයේ ප්‍රථම භාගයේදී දක්නට තිබූ මුළු ප්‍රසාරණය රුපියල් දශ ලක්ෂ 183 ක් විය. ජූලි මාසයේදී මුදල් සැපයුම රුපියල් දශලක්ෂ 16 කින් අඩුවීමත් සමගම, ප්‍රථම අඩ වසර තුළදී ඇති වූ මෙකී වේගවත් වැඩිවීම නැවතිණි. ඊලඟ මාස තුනේදී, මුදල් සැපයුම තුළ සමහර වැඩිවීම් ඇති වුවද නොවැම්බර් මාසයේදී රුපියල් දශලක්ෂ 35 ක විශාල අඩුවීමක්ද, දෙසැම්බර් මාසයේදී රුපියල් දශලක්ෂ 10 ක සුළු අඩුවීමක්ද දක්නට තිබිණි. වසරේ දෙවන භාගය සමස්ථයක් වශයෙන් ගත් විට, මුදල් සැපයුමෙහි වැඩිවීමක් දක්නට නොතිබිණි. ජූනි මාසය අවසානයේදී මෙන්ම, දෙසැම්බර් මාසය අවසානයේදී ද එහි මට්ටම රුපියල් දශලක්‍ෂ 2150 ක්ව පැවතිණි.

### II (ඇ) 1 සංඛ්‍යා සටහන

### මුදල් සැපයුම

රුපියල් දශ ලක්ෂ වලිනි

| කාලච්ඡේදය අවසානයේදී | 1966 | 1967 | 1968 | 1969 | 1970 | 1971 | % වෙනස 1966 සහ 1967 අතර | % වෙනස 1967 සහ 1968 අතර | % වෙනස 1968 සහ 1969 අතර | % වෙනස 1969 සහ 1970 අතර | % වෙනස 1970 සහ 1971 අතර |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ජනවාරි .. | 1,693 | 1,598 | 1,792 | 1,883 | 1,872 | 1,943 | − 5·6 | +12·1 | + 5·1 | − 0·6 | + 3·8 |
| පෙබරවාරි .. | 1,674 | 1,687 | 1,793 | 1,880 | 1,884 | 1,973 | + 0·8 | + 6·3 | + 4·8 | + 0·2 | + 4·7 |
| මාර්තු .. | 1,666 | 1,817 | 1,831 | 1,911 | 1,932 | 2,050 | + 9·1 | + 0·8 | + 4·4 | + 1·1 | + 6·1 |
| අප්‍රේල් .. | 1,675 | 1,781 | 1,857 | 1,917 | 1,942 | 2,101 | + 6·3 | + 4·3 | + 3·2 | + 1·3 | + 8·2 |
| මැයි .. | 1,698 | 1,723 | 1,869 | 1,900 | 1,974 | 2,120 | + 1·5 | + 8·5 | + 1·7 | + 3·9 | + 7·4 |
| ජූනි .. | 1,692 | 1,731 | 1,857 | 1,918 | 1,990 | 2,150 | + 2·3 | + 7·3 | + 3·3 | + 3·7 | + 8·0 |
| ජූලි .. | 1,757 | 1,718 | 1,831 | 1,872 | 1,983 | 2,134 | − 2·2 | + 6·6 | + 2·2 | + 5·9 | + 7·6 |
| අගෝස්තු .. | 1,702 | 1,678 | 1,839 | 1,880 | 2,017 | 2,143 | − 1·4 | + 9·6 | + 2·2 | + 7·3 | + 6·2 |
| සැප්තැම්බර් .. | 1,681 | 1,700 | 1,850 | 1,885 | 2,066 | 2,149 | + 1·1 | + 8·8 | + 1·9 | + 9·6 | + 4·0 |
| ඔක්තෝබර් . | 1,682 | 1,761 | 1,889 | 1,891 | 2,068 | 2,175 | + 4·7 | + 7·3 | + 0·1 | + 9·4 | + 5·2 |
| නොවැම්බර් .. | 1,655 | 1,787 | 1,896 | 1,902 | 1,927 | 2,140 | + 8·0 | + 6·1 | + 0·3 | + 1·3 | +11·0 |
| දෙසැම්බර් .. | 1,659 | 1,808 | 1,913 | 1,883 | 1,967 | 2,150 | + 9·0 | + 5·8 | − 1·6 | + 4·5 | + 9·3 |
| මාසික සාමාන්‍යය .. | 1,686 | 1,732 | 1,851 | 1,893 | 1,969 | 2,102 | + 2·7 | + 6·9 | + 2·3 | + 4·0 | + 6·7 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

1971 වර්ෂයේදී, මූල්‍ය ප්‍රසාරණයෙහි විශේෂ ලක්‍ෂණයක් වූයේ, 1950 මැද භාගයේ පටන් පැවති රටාවෙහි ආපසු හැරීමක් ඇතිවීමයි. 1969 දක්වා වූ වර්ෂයන් තුළදී (1964 සහ 1965 හැර) මූල්‍ය ප්‍රසාරණයක් ඇති වූයේ බැංකු ක්‍රමයේ[1] ශුද්ධ විදේශීය වත්කම්හි සැලකිය යුතු අඩුවීම් පවතිද්දීය. එහෙත් 1971 වර්ෂයේදී ප්‍රසාරණය සම්පූර්ණයෙන්ම එකී වත්කම් වැඩිවීම තුළින් ඇති වූවකි. ඇත්තෙන්ම මෙම වර්ෂයේදී මුදල් සැපයුමෙහි වූ වැඩිවීම, බැංකු ශුද්ධ විදේශීය වත්කම්හි වූ වැඩිවීමට වඩා අඩු විය. මෙවර ශුද්ධ විදේශීය වත්කම්හි වූ වැඩිවීම රුපියල් දශලක්‍ෂ 200·5 ක් වූයේ 1955 වර්ෂයෙන් පසු වාර්ත වූ විශාලතම වැඩිවීම විය. මුදල් සැපයුම වඩා අඩු ප්‍රමාණයකින් ඉහළ යාමට හේතු වූයේ මුළු දේශීය අංශයේ (රාජ්‍ය සහ පෞද්ගලික අංශයන්) කටයුතු තුළින් ඇති වූ සංකෝචනාත්මක බලපෑම හේතුවෙනි. බැංකු ක්‍රමයත් සමග වූ රාජ්‍ය මූල්‍ය කටයුතු වල ප්‍රතිඵලයක් වශයෙන් රුපියල් දශ ලක්ෂ 54·1 ක ප්‍රසාරණයක් ඇති වූ අතර එකී බලපෑම, පෞද්ගලික අංශයේ කටයුතු රුපියල් දශලක්‍ෂ 76·2 කින් සංකෝචනාත්මක වීම නිසා ප්‍රමාණයටත් වඩා සමහන් විය.

විමර්ශණයට භාජනය වූ වර්ෂය තුළදී, දකිය හැකි තවත් සැලකිය යුතු ලක්‍ෂණයක් වූයේ, බැංකු ක්‍රමය මත රජය අඩුවෙන් රැඳී සිටීමයි. රාජ්‍ය කටයුතු නිසා ඇති වූ රුපියල් දශලක්‍ෂ 54·1 ක ප්‍රසාරණය 1956 න් පසු දක්නට තිබූ අඩුම ප්‍රමාණය විය. එමෙන්ම පෞද්ගලික අංශයේ කටයුතු තුළින් ඇති වූ රුපියල් දශලක්‍ෂ 76·2 ක සංකෝචනය, මෙතෙක් වාර්තා ගතවූ විශාලතම වැඩිවීම විය සංක්‍ෂෙප වශයෙන් ගත් විට, පණස් ගණන් මැද භාගයේ සිට මුදල් සැපයුමෙහි වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් තුඩු දුන් දේශීය ණය මැවීම්, 1971 වර්ෂයේදී සංකෝචනාත්මක බලපෑමක් ඇති කළේය. මෙවර මුදල් සැපයුමෙහි ඇතිවූ ප්‍රසාරණය මුළුමනින්ම විදේශීය අංශයේ බලපෑම් නිසා සිදු වූවකි.

මුදල් සැපයුම සැලකිය යුතු අන්දමින් ප්‍රසාරණය වීමේ ප්‍රතිවිපාකයන්, ජාතික නිෂ්පාදිතයෙහි සියයට 0·9 පමණක් වූ වැඩිවීම හා එක් කොට බලන විට එමගින් මිළ ගණන් කෙරෙහි දැඩි පීඩනයක් ඇති කරවීමට ඉඩ තිබිණි. පවත්නා පාරිභෝගික මිළ දර්ශකය (එහි සියළුම සීමාකම් සහිතව) අනුව මනින විට, එය මෙම වර්ෂය තුළදී සියයට 6 කට ආසන්න ප්‍රමාණයකින් වැඩි වී ඇති බව පෙනේ. කෙසේ වුවද, මුදලෙහි සංසරණ ප්‍රවේගයෙහි අඩුවීමක් තුළින්, මිළ ගණන් කෙරෙහි වූ පීඩනය තරමක් දුරට ලිහිල් වූයේ යයි සිතිය හැක. සංසරණ ප්‍රවේගයෙහි වෙනස දැක්වීම සඳහා ඇති එකම දර්ශකය මහජනයා සතු ඉල්ලුම් තැන්පතු සඳහා වූ පිරිවැටුම් නුපාතිකයයි. 1971 වර්ෂයේදී, එහි මාසික සාමාන්‍යය සියයට 12·6 කින් අඩු විය.

### 1 (ආ) මුදල් සැපයුම කෙරෙහි බලපෑ සාධක

මුදල් සැපයුම කෙරෙහි බලපෑ සාධකයන් පිළිබඳ විශ්ලේෂණයක් 11 (ඇ) 2 සංඛ්‍යා සටහනින් පෙන්නුම් කෙරේ.

මීට කලින්ද දක්වා ඇති පරිදි, 1971 වර්ෂයේදී, මුදල් සැපයුම කෙරෙහි බලපෑ ප්‍රධානතම ප්‍රසාරණාත්මක සාධකය වූයේ, විදේශීය ගෙවීම් අතිරික්තයයි. කෙසේ වුවද ජංගම ගිණුමෙහි ශේෂයෙහි රුපියල් දශලක්ෂ 303·7 ක හිඟයක් දක්නට තිබිණි. ඊට අමතර වශයෙන් පෞද්ගලික ප්‍රාග්ධන සංචලනයන්හි රුපියල් දශලක්ෂ 4·7 ක හිඟයක්ද වූ අතර, නිල ප්‍රාග්ධන ආපසු ගෙවීම් රුපියල් දශලක්‍ෂ 96·2 ක් විය. මෙකී ගනුදෙනු තුළින් ඇතිවූ සම්පූර්ණ හිඟයම බැංකු ක්‍රමය මගින් පියවන ලද නම්,

1. 1970 වර්ෂයේදී වූ අඩුවීම රුපියල් දශලක්ෂ 1·5 ක් වූයේ සැලකියයුතු නොවන තරම් කුඩා එකකි; එහෙයින් දැනට පවත්නා රටාවෙහි ආරම්භය එම වර්ෂයේදී ඇතිවූයේයයි කිවහැක.

## II (ඈ) 2 සංඛ්‍යා සටහන

### මුදල් සැපයුමේ වෙනස්වීම් සහ එයට පදනම් වූ සෘධක (වර්ෂාවසාන සංඛ්‍යා අනුවය.)

රුපියල් දශලක්ෂ වලිනි.

| මුදල් සැපයුමට බලපාන සාධක | 1965 අවසානයේ සිට 1966 අවසානයට | | 1966 අවසානයේ සිට 1967 අවසානයට | | 1967 අවසානයේ සිට 1968 අවසානයට | | 1968 අවසානයේ සිට 1969 අවසානයට | | 1969 අවසානයේ සිට 1970 අවසානයට | | 1970 අවසානයේ සිට 1971 අවසානයට | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රසාරණාත්මක සාධක | සංකෝචනාත්මක සාධක | ප්‍රසාරණාත්මක සාධක | සංකෝචනාත්මක සාධක | ප්‍රසාරණාත්මක සාධක | සංකෝචනාත්මක සාධක | ප්‍රසාරණාත්මක සාධක | සංකෝචනාත්මක සාධක | ප්‍රසාරණාත්මක සාධක | සංකෝචනාත්මක සාධක | ප්‍රසාරණාත්මක සාධක | සංකෝචනාත්මක සාධක |
| 1· බැංකු සතු විදේශිය වත්කම් (ශුද්ධ) .. .. | — | 196·3 | — | 91·5 | — | 115·7 | — | 299·6 | — | 1·5 | 200·5 | — |
| 2· පෞද්ගලික අංශය‡ .. .. | 137·2 | 79·6 | 106·5 | 133·1 | 264·1 | 165·4 | 226·0 | 193·8 | 219·4 | 238·3 | 152·6 | 228·8 |
| (අ) සමුපකාර ආයතනවලට දෙන ලද වෙළඳ බැංකු ණය .. | 25·8 | — | 7·3 | — | 18·5 | — | 19·9 | — | 146·3 | — | — | 3·4 |
| (ආ) පෞද්ගලික අංශයේ අනිකුත් ගනුදෙනුකරුවන්ට දෙනලද වෙළඳ බැංකු ණය .. .. | 33·5 | — | 87·8 | — | 155·0 | — | 136·2 | — | — | 42·0 | 84·1 | — |
| (ඇ) සමුපකාර ආයතනවල කාලින හා ඉතුරුම් තැන්පතු .. | — | 2·3 | — | 1·4 | — | 1·5 | — | 2·9 | — | 7·6 | — | 11·9 |
| (ඈ) පෞද්ගලික අංශයේ අනිකුත් ගනුදෙනුකරුවන්ගේ කාලීන හා ඉතුරුම් තැන්පතු .. .. | — | 65·3 | — | 49·5 | — | 100·8 | — | 144·4 | — | 188·7 | — | 132·0 |
| (ඉ) වෙළඳ බැංකුවල අනිකුත් වගකීම් සහ ගිණුම් (ශුද්ධ) .. | — | 12·0 | — | 31·0 | — | 40·9 | — | 35·7 | 12·4 | — | — | 81·5 |
| (ඊ) රජයේ සමායතනවලට දෙන ලද වෙළඳ බැංකු ණය .. | 27·7 | — | 11·4 | — | 90·6 | — | 69·9 | — | 43·2 | — | 62·3 | — |
| (උ) රජයේ සමායතන සතු කාලීන හාඉතුරුම් තැන්පතු .. | 50·2 | — | — | 51·2 | — | 22·2 | — | 10·8 | 17·5 | — | 6·2 | — |
| 3· රාජ්‍ය අංශය | 207·5 | 125·5 | 266·9 | — | 306·9 | 184·5 | 243·1 | 7·6 | 349·8 | 244·6 | 181·8* | 127·7 |
| (අ) වෙළඳ බැංකු වෙතැති භාණ්ඩාගාර බිල්පත්, රජයේ හා රජය ඇපවූ සුරැකුම් පත් සහ රජයේ ආනයන බිල්පත් .. | — | 62·6 | 74·4 | — | — | 114·9 | 4·9 | — | 193·4 | — | 52·8 | — |
| (ආ) රාජ්‍ය ගිණුම යටතේ මිලදී ගත් මුදල් ශීර්ෂ .. .. | — | — | — | — | — | — | 8·2 | — | 0·7 | — | — | 3·5 |
| (ඇ) මහ බැංකුව වෙතැති භාණ්ඩාගාර බිල්පත් සහ රජයේ හා රජය ඇපවූ සුරැකුම් පත් .. .. | 155·9 | — | 109·9 | — | 269·4 | — | 112·0 | — | 126·2 | — | — | 19·7 |
| (ඈ) මහ බැංකුවේ අත්තිකාරම් .. .. | 26·4 | — | 12·7 | — | 37·5 | — | — | 7·6 | 29·5 | — | 61·0 | — |
| (ඉ) මහ බැංකුවේ අනිකුත් වගකීම් සහ ගිණුම් (ශුද්ධ) .. | 25·2 | — | 13·9 | — | — | 0·2 | 46·1 | — | — | 120·4 | — | 104·5 |
| (ඊ) බැංකු ක්‍රමය වෙතැති රජයේ තැන්පතු හා භාණ්ඩාගාරය හා කච්චේරි වෙතැති මුදල් ශේෂ .. .. | — | 62·9 | 56·0 | — | — | 69·4 | 71·9 | — | — | 124·2 | 68·0* | — |
| 4· භුවමාරුවෙහි පවත්නා ශීර්ෂයන් සඳහා ගැලපිළි .. .. | — | 0·1 | — | 0·1 | 0·2 | — | 1·7 | — | — | 1·1 | 4·7 | — |
| මුළු ප්‍රසාරණාත්මක/සංකෝචනාත්මක සාධක .. | 344·7 | 401·5 | 373·4 | 224·7 | 571·2 | 465·6 | 470·8 | 501·0 | 569·2 | 485·5 | 539·6* | 356·5 |
| මුදල් සැපයුමෙහි වෙනස .. | − 56·8 | | + 148·7 | | + 105·6 | | − 30·1 | | + 83·5 | | + 183·1* | |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

‡ වට්ටම් කළ අපනයන බිල්පත්වල වටිනාකම බැංකු විදේශිය වත්කම් යටතේ ඇතුළත් කෙරිණ.

* තාවකාලිකයි.

මුදල් සැපයුම කෙරෙහි රුපියල් දශලක්‍ෂ 404·6 ක පමණ සංකෝචනාත්මක බලපෑමක් ඇති වන්නට ඉඩ තිබිණි. කෙසේ හෝ මෙම ප්‍රබල සංකෝචනාත්මක බලපෑම, රජය මගින් රුපියල් දශලක්‍ෂ 570·8 ක විදේශාධාර ලැබීමත් කෙටිකාලීන ණය රුපියල් දශලක්ෂ 33·0 කින් ශුද්ධ ලෙස වැඩිවීමත් නිසා පමණටත් වඩා සමහන් විය. ඒ අනුව විදේශීය අංශය තුළින් මුදල් සැපයුම කෙරෙහි ඇතිවූ ශුද්ධ ප්‍රසාරණාත්මක බලපෑම රුපියල් දශලක්ෂ 200·5 ක් විය. 1970 වර්ෂයේදී පැවති තත්ත්වය ඊට ඉඳුරාම වෙනස් වූයේ, එම අංශය තුළින් රුපියල් දශලක්ෂ 1·5 ක සංකෝචනයක් ඇතිවී තිබිණි.

බැංකු ක්‍රමයෙහි ජාත්‍යන්තර ණයගැති භාවය පිළිබඳ තත්වය වඩා යහපත් තත්ත්වයට හැරීම, විදේශීය වත්කම් වැඩිවීම තුළින් සහ වඩාත් පැහැදිලි වශයෙන් විදේශීය වගකීම්හි අඩුවීම තුළින් පිළිබිඹු විය. මහ බැංකුවේ ජාත්‍යන්තර සංචිතය රුපියල් දශලක්ෂ 44·2 කින් ඉහළ නැගුණි. ඊට හේතු වූයේ, විදේශයන්හි ඇති මුදල් හා ශේෂයන් රුපියල් දශලක්ෂ 37·9 කින් හා විදේශීය රාජ්‍ය සුරැකුම් පත් රුපියල් දශලක්ෂ 6·4 කින් වැඩිවීමයි. පසුව සඳහන් වැඩිවීම, සම්පූර්ණයෙන්ම ඇති වූයේ ප්‍රතිප්‍රමාණ කිරීම හේතුවෙනි. වෙළඳ බැංකුවල විදේශ වත්කම්ද රුපියල් දශලක්ෂ 34·7 කින් ඉහළ ගියේය. මහ බැංකුවේ විදේශීය වගකීම් රුපියල් දශලක්ෂ 128·0 කින් පහළ වැටිණි. 1971 වර්ෂයේදී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් මිලදී ගැනීම් රුපියල් දශලක්ෂ 83·4 ක්වූ අතර, ප්‍රතිමිලදී ගැනීම් රුපියල් දශලක්ෂ 139·2 ක් විය; මේ අනුව සේවා ගාස්තු ගෙවීම් සඳහා ඉඩහළ විට මහ බැංකුවත් සමග වූ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි ශේෂයන්, රුපියල් දශලක්ෂ 41·0 කින් අඩු විය. මහ බැංකුව විදේශයන්හි ඇති බැංකු සහ අනිකුත් ආයතනයන්ගෙන් ලබාගත් ණය ප්‍රමාණයන්ද රුපියල් දශලක්ෂ 77·7 කින් අඩු කෙරිණි. අනෙක් අතට, වෙළඳ බැංකුවල විදේශීය වගකීම් රුපියල් දශලක්ෂ 6·5 කින් වැඩි වුණි. මෙහි ප්‍රතිඵලය වූයේ, බැංකු ක්‍රමයේ විදේශීය වගකීම්හි රුපියල් දශලක්ෂ 121·5 ක ශුද්ධ අඩුවීමකි.

1971 වර්ෂයේදී, රාජ්‍ය අංශයේ කටයුතු, මුදල් සැපයුම කෙරෙහි රුපියල් දශලක්ෂ 54·1 ක ප්‍රසාරණාත්මක බලපෑමක් ඇති කළේය. එය ඉකුත් වර්ෂයේදී වූ ප්‍රමාණයන්ට වඩා රුපියල් දශලක්ෂ 51·1 කින් අඩු විය. බැංකු ක්‍රමයට වූ රජයේ ණයගැති භාවයෙහි වැඩිවීම රුපියල් දශලක්ෂ 90·6 ක් වූයේ, එය 1970 වර්ෂයේ ප්‍රමාණයට වඩා රුපියල් දශලක්ෂ 259·2 කින් අඩු විය. මහ බැංකුවේ රාජ්‍ය පත්‍ර දැරීම් රුපියල් දශලක්ෂ 19·7 කින් අඩුවූ අතර, තාවකාලික අත්තිකාරම් රුපියල් දශලක්ෂ 61·0 කින් ඉහළ ගියේය. මේ අනුව, 1971 වර්ෂයේදී, මහ බැංකුව වෙතවූ රජයේ ණයගැති භාවය, රුපියල් දශලක්‍ෂ 41·3 කින් වැඩි විය. එය, ඉකුත් වර්ෂයේදී වැඩි වූ ප්‍රමාණයෙන් තුනෙන් පංගුවකටත් වඩා අඩු විය. රජයට දෙන ලද වෙළඳ බැංකු ණය ප්‍රමාණයෙහි වැඩිවීමද, රුපියල් දශලක්ෂ 49·3 ක් වූයේ, 1970 වර්ෂයේදී පැවති වැඩිවීම වන රුපියල් දශලක්ෂ 194·1 ට වඩා බෙහෙවින් අඩුය. 1971 වර්ෂයේදී වෙළඳ බැංකු ණය ප්‍රමාණයෙහි වැඩිවීම, භාණ්ඩාගාර බිල්පත් රුපියල් දශලක්ෂ 39·4 කින්ද, රජයේ සහ රජය මගින් ඇපවූ සුරැකුම්පත් රුපියල් දශලක්‍ෂ 11·3 කින්ද, රජයේ ආනයන බිල්පත් රුපියල් දශලක්‍ෂ 2·4 කින්ද, වැඩිවීමෙන් සහ රජයේ ගිණුම මත මිළට ගත් චෙක්පත් ආදී ස්වරූපයෙන් රජයට දෙන ලද කෙටිකාලීන ණය රුපියල් දශලක්‍ෂ 3·5 කින් අඩුවීමෙන්ද සැකසිණි. 1971 වර්ෂයේදී රජය එහි මුදල් ශේෂයන් රුපියල් දශලක්‍ෂ 68·0 කින් අඩු කෙළේය. ඉකුත් වර්ෂයේදී ඒවා රුපියල් දශලක්‍ෂ 124·2 කින් වැඩිවී තිබිණි. මේ අනුව බැංකු ක්‍රමය මගින් රජයට දෙන ලද ණය ප්‍රමාණයෙහි වැඩිවීමත්, රජයේ මුදල් ශේෂයන් අඩුවීමත් හේතුකොට ගෙන ඇතිවූ රුපියල් දශලක්‍ෂ 158·6 ක මුළු ප්‍රසාරණාත්මක බලපෑම, මහ බැංකුවේ "අනෙකුත් වගකීම් සහ ගිණුම්" (ශුද්ධ) රුපියල් දශලක්‍ෂ 104·5 කින් වැඩිවීම නිසා සැලකියයුතු ප්‍රමාණයකින් සමහන් විය. මෙසේ මුදල් සැපයුමෙහි ශුද්ධ ප්‍රසාරණය කෙරෙහි රාජ්‍ය අංශය වෙත පැවරිය හැකි ප්‍රමාණය රුපියල් දශලක්‍ෂ 54·1කි.

1971 වර්ෂයේදී, පෞද්ගලික අංශයට (සමුපකාරයන් සහ රාජ්‍ය සංස්ථාවන් ඇතුළත්ව) දෙන ලද බැංකු ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 143·0 කින් ඉහළ ගියේය. 1970 වර්ෂයේදී එහි රුපියල් දශලක්ෂ 147·5 ක්වූ ප්‍රමාණයක වැඩිවීමක් දක්නට තිබුණි. 1970 දී රුපියල් දශලක්ෂ 146·3 ක වාර්තාගත වැඩිවීමක් පෙන්නුම් කළ සමුපකාර ආයතනයන්ට දුන් බැංකු ණය ප්‍රමාණය මෙම වර්ෂය තුළදී රුපියල් දශලක්ෂ 3·4 කින් අඩු වුණි. කෘෂිකාර්මික ණය ක්‍රමය යටතේ සමුපකාරයනට දෙන ලද බැංකු ණය ප්‍රමාණයෙන් නොපියවා ඇති ශේෂය රුපියල් දශලක්ෂ 22·6 කින් වැඩිවූ අතර, සහතික මිළ ක්‍රමය යටතේ රජයට වී විකිණීම සම්බන්ධයෙන් බඩු තොග කුවිතාන්සි ඇප කොට දෙන ලද අත්තිකාරම් රුපියල් දශලක්ෂ 68·2 කින් අඩු විය. සමුපකාරයනට දෙන ලද අනෙකුත් ණය රුපියල් දශලක්ෂ 42·2 කින් ඉහළ ගියේය. ඉකුත් වර්ෂයේදී රුපියල් දශලක්ෂ 144·3 කින් වැඩිවී තිබූ බඩු තොග කුවිතාන්සි අත්තිකාරම් 1971 වර්ෂයේදී අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ඒවා, රජය මගින් අප්‍රමාදව ගෙවීමයි. මෙම අත්තිකාරම් වල මාසික සාමාන්‍ය මට්ටම රුපියල් දශලක්ෂ 128·3 ක්වූ අතර 1970 වර්ෂයේ සාමාන්‍යයට වඩා රුපියල් දශලක්ෂ 30·1 කින් ඉහල් විය.

රාජ්‍ය සංස්ථාවන්ට දුන් වෙළඳ බැංකු ණය රුපියල් දශලක්ෂ 62·3 කින් ඉහළ නැඟුණි. 1970 වර්ෂයේදී එහි වැඩිවීම රුපියල් දශලක්ෂ 43·2 ක් විය. සංස්ථාවන්හි සංඛ්‍යාව වැඩිවීමත්, පවත්නා සංස්ථාවන්හි කටයුතු පුළුල් වීමත් 1971 වර්ෂයේදී වූ විශාල වැඩිවීම කෙරෙහි හේතු වූයේ යයි සිතිය හැක. පෞද්ගලික අංශයේ අනෙකුත් ගනුදෙනු-කරුවන්ට දෙන ලද බැංකු ණය 1971 වර්ෂයේදී රුපියල් දශලක්ෂ[1] 84·1 කින් වැඩි විය. 1970 වර්ෂයේදී ඒවා රුපියල් දශලක්ෂ 42·0 කින් අඩුවී තිබිණි. මෙවර ඇතිවූ වැඩිවීමෙන් විශාල කොටසක්, එනම් රුපියල් දශලක්ෂ 49·0 ක් පමණ දක්නට තිබුණේ වර්ෂයේ අවසාන මාසයේදීය. පෞද්ගලික අංශයට (රාජ්‍ය සංස්ථාවන් සහ සමුපකාරයන් හැර) දුන් රුපියල් දශලක්ෂ 84·1 ක ණය ප්‍රසාරණයට ප්‍රතිවිරුද්ධව වෙළඳ බැංකු වෙතැති කාලීන හා ඉතුරුම් තැන්පතු රුපියල් දශලක්ෂ 132·0 කින් ඉහළ ගියේය.

පෞද්ගලික අංශයට (රාජ්‍ය සංස්ථාවන් සහ සමුපකාරයන්ද ඇතුළත්ව) දුන් ණය ප්‍රමාණයෙහි වැඩිවීම තුළින් මුදල් සැපයුම කෙරෙහි ඇතිවූ ප්‍රසාරණාත්මක බලපෑම, මෙම අංශය සතුව වෙළඳ බැංකු වෙතවූ කාලීන හා ඉතුරුම් තැන්පතු වැඩිවීමක් මගින් විශාල ප්‍රමාණයකට සමහන් කෙරිණි. මෙම තැන්පතු රුපියල් දශලක්ෂ 137·7 කින් ඉහළ ගියේය. ඉකුත් වර්ෂයේදී ඒවායෙහි වූයේ රුපියල් දශලක්ෂ 178 8 ක වඩාත් විශාල වූ වැඩිවීමකි. 1971 වර්ෂයේදී වූ වැඩිවීමෙන් සමුපකාරයන් සතු කොටස රුපියල් දශලක්ෂ 11·9 ක් පමණක්වූ අතර රාජ්‍ය සංස්ථාවන් සතු තැන්පතු රුපියල් දශලක්ෂ 6·2 කින් අඩු වුණි. වෙළඳ බැංකුවල 'අනෙකුත් වගකීම් සහ ගිණුම් (ශුද්ධ)' රුපියල් දශලක්ෂ 81·5 කින් වැඩිවීම හේතුකොටගෙන තවත් සංකෝචනාත්මක බලපෑමක් ඇති කෙරිණි. මේ අනුව, පෞද්ගලික අංශය තුළින් මුදල් සැපයුම කෙරෙහි ජනනය වූ ශුද්ධ සංකෝචනාත්මක බලපෑම රුපියල් දශලක්ෂ 76·2 ක් වූයේය.

සංක්ෂෙප කොට ගත් විට, මෙම වර්ෂයේදී මුදල් සැපයුමෙහි වර්ධනය සහ එයට බලපාන ලද සාධකයන්, පණස් ගණන් මුල් කාලයේදී මුදල් සැපයුමෙහි පැවති රටාව සිහිපත් කරවයි. පණස් ගණන් මුලදී ප්‍රධාන වශයෙන්ම විදේශීය අංශයේ බලපෑම තුළින් මුදල් සැපයුම වේගයෙන් වැඩිවීමේ ප්‍රවණතාවක් දැකිය හැකි විය. බැංකු ක්‍රමය වෙත රජයේ රුඳියාව විශාල වශයෙන් අඩුවීමද 1971 වර්ෂයේදී දක්නට තිබූ තවත් විශේෂ ලක්ෂණයකි. ප්‍රධාන වශයෙන්ම 1970 ඔක්තෝබර් මාසයේදී කළ විමුල්‍යනයෙහි

---

1. මෑතක් වන තෙක් පෞද්ගලික ආයතනයක් හැටියට කටයුතු කළ, පසුව රාජ්‍ය සංස්ථාවක් බවට පරිවර්තනය කරනු ලැබුවත්, නීතිමය අවශ්‍යතාවයන් සම්පූර්ණ කරන තෙක් පෞද්ගලික ආයතනයක් වශයෙන් සලකනු ලැබූ එක් රාජ්‍ය සංස්ථාවකට දෙන ලද ණය ප්‍රමාණයෙහි රුපියල් දශලක්ෂ 20 ක පමණ වැඩිවීමක්ද, රුපියල් දශලක්ෂ 84·1 වැඩිවීමෙහි ඇතුළත් වේ. මේ අනුව නියම වශයෙන් පෞද්ගලික අංශයට දුන් ණය ප්‍රමාණයෙහි වැඩිවීම රුපියල් දශලක්ෂ 64 ක් පමණ බව කිව හැක.

ප්‍රතිඵලයක් වශයෙන් විශාල පරිමාණ බැංකු නොවන වෙළඳපොල ණය ගැනීම වැඩිවීමත් විදේශ මූල්‍ය පහසුකම් වැඩිවීමත්, බැංකු ක්‍රමයෙන් රජයේ ණයගැනීම අඩුවීමට හේතුවූ ප්‍රධාන සාධකයන් විය. මුදල් සැපයුම කෙරෙහි පෞද්ගලික අංශයේ (රාජ්‍ය සංස්ථාවන් සහ සමුපකාරයන් ඇතුළුව) සෘණ බලපෑම්, එම අංශයේ කටයුතු සැලකිය යුතු අන්දමින් අඩාලවී ඇති බව පෙන්නුම් කරන්නකි. විදේශ විනිමය බාධකයන්, පෞද්ගලික අංශයේ ක්ෂෙත්‍රය තුළට මෙම වර්ෂයේදී රාජ්‍ය සංස්ථාවන් ඇතුළුවීමත් එමෙන්ම, සමහර විට සංස්ථා අංශයේ ප්‍රබල ව්‍යාප්තිය නිසා ඇති වූ අවදනමත් යන සාධකයන් පෞද්ගලික අංශයේ කටයුතු අඩාල වීමට හේතු වූයේ යයි සිතිය හැක. රාජ්‍ය සංස්ථාවන්ද නිසැක-යෙන්ම විදේශීය විනිමය බාධකයනට මුහුණ පෑම හේතුවෙන් පෞද්ගලික අංශයේ කාර්යයන් අඩුවීමෙන් ඇතිවූ පරතරය සම්පූර්ණයෙන්ම පියවීමට හැකියාවක් නොවීය ත්‍රස්තවාදී කලබල වැනි අනෙකුත් සාධකද, සමස්තයක් වශයෙන් පෞද්ගලික අංශයේ කාර්යයන් කෙරෙහි බලපාන්නට ඇත. මේ අනුව මෙම වර්ෂයේදී, ආර්ථිකයෙහි වර්ධන අනුපාතිකය සියයට 0·9 ක් පමණක් වූ අතර ඒ අනුව බලන විට, මුදල් සැපයුමෙහි සියයට 9·3 ක ප්‍රසාරණය සැලකිය යුතු තරම් ඉහල මට්ටමක එකකි.

### 1 (ඇ) බැංකු නොවන පෞද්ගලික අංශයේ ද්‍රවශීලතාවය

1969-1971 දක්වා වර්ෂයන් සඳහා, බැංකු නොවන පෞද්ගලික අංශයේ ප්‍රාථමික සහ ද්විතියික ද්‍රවශීල වත්කම් ව්‍යාප්තිය, II (ඇ) 3 සංඛ්‍යා සටහනින් ඉදිරිපත් කෙරේ.

බැංකු නොවන පෞද්ගලික අංශයේ මුළු ද්‍රවශීල වත්කම් එකතුව රුපියල් දශලක්ෂ 537·8 කින් හෙවත් සියයට 10.8 කින් ඉහළ නැගුණි. ප්‍රාථමික ද්‍රවශීල වත්කම් රුපියල් දශලක්ෂ 183·1 කින් හෙවත් සියයට 9·3 කින්ද, ද්විතියික ද්‍රවශීල වත්කම් රුපියල් දශලක්ෂ 354·7 කින් හෙවත් සියයට 11·8 කින්ද වැඩිවීම ඊට හේතු සාධක විය. 1971 වර්ෂයේදී ප්‍රාථමික ද්‍රවශීල වත්කම්හි වූ වැඩිවීම, ඉකුත් වර්ෂයේදී පැවැති වැඩිවීම වූ රුපියල් දශලක්ෂ 83·5 ක හෙවත් සියයට 4·4 ක ප්‍රමාණය මෙන් දෙගුණයටත් අධිකවූ අතර, ද්විතියික ද්‍රවශීල වත්කම්හිවූ වැඩිවීම, 1970 වර්ෂයේදී පැවති රුපියල් දශලක්ෂ 392·2 ක හෙවත් සියයට 15·0 ක වැඩි වීමට වඩා සැලකිය යුතු ලෙස කුඩා එකකි. එසේ වුවද, මුළු ද්‍රවශීල වත්කම් සඳහා වූ ද්විතියික ද්‍රවශීල වත්කම් කොටස් අනුපාතය, 1970 අවසානයේදී සියයට 60 5 සිට 1971 වර්ෂය අවසාන වන විට සියයට 61·0 දක්වා වැඩි විය.

1971 වර්ෂයේදී ප්‍රාථමික ද්‍රවශීල වත්කම් වෙනස්වීම සම්බන්ධයෙන් අසතුටුදායක ලක්ෂණයක් වූයේ, මෙම වත්කම් වැඩිවීම සම්පූර්ණයෙන්ම පාහේ ව්‍යවහාර මුදලින් යුක්තවීමයි. ඉකුත් දශකයේදී ඉල්ලුම් තැන්පතුවලට සාපේක්ෂව ව්‍යවහාර මුදල් සඳහා මහජන වරණය සැලකියයුතු ලෙස වැඩිවෙමින් පැවතීම පිළිබඳව 1970 වාර්ෂික වාර්තාවේදී අදහස් දක්වා තිබූ අතර 1970 ඔක්තෝබර් මාසයේදී කරන ලද විමුල්‍යනය මගින් එම උපනතිය නවතාලමින් මුදල් සැපයුමෙහි ව්‍යවහාර මුදල් සංයුතිය අඩු කිරීමේ ප්‍රතිවිපාකයන් ක්‍රියාත්මක වූ බවත් පෙන්නුම් කරන ලදී. කෙසේ වුවද, 1970 අගදී සියයට 47·6 ක්ව පැවැති මුදල් සැපයුමෙහිවූ ව්‍යවහාර මුදල් අනුපාතය 1971 අවසානය වන විට සියයට 51·9 දක්වා අනුක්‍රමිකව වැඩිවීමෙන් පෙර පැවති උපනතියම යළිත් ක්‍රියාත්මක වන බව පැහැදිලිවම පෙනේ. 1971 මුදල් සැපයුමෙහි ඇති වූ රුපියල් දශලක්ෂ 183·1 න් රුපියල් දශලක්ෂ 180·8 ක් පමණවූ ප්‍රමාණයක්ම ව්‍යවහාර මුදල් ස්වරූපයෙන් යුක්තවීම ඇත්තෙන්ම බැරෑරුම් ප්‍රශ්නයක් වෙයි. මහජනයා සතු ව්‍යවහාර මුදල් දැරීම කෙරෙහි බලපාන සාමාන්‍ය සාධකයන්ට අමතරව 1970 ඔක්තෝබර් මාසයේ සිට ක්‍රියාත්මක වන බැංකු හර බද්දද හේතුවී යයි සිතිය හැක. ඉල්ලුම් තැන්පතුවල නොසැලකිය යුතු තරම්වූ වැඩිවීම, එම තැන්පතුවල මාසික සාමාන්‍ය පිරිවැටුම් අනුපාතිකයෙහි සියයට 12·6 ක අඩුවීමක් සමගද සිදුවූවකි. මෙම තත්වය, බැංකු හර බද්දෙහි බලපෑම කෙරෙහි අවධානය යොමු කරවීමට තුඩු දෙයි.

## II (ඈ) 3 සංඛ්‍යා සටහන

## බැංකු නොවන පෞද්ගලික අංශයෙහි ද්‍රවශීල වත්කම්

| සැකැස්ම | ප්‍රමාණය (රුපියල් දශලක්ෂ) | | | දළ ජාතික නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් වශයෙන් (අ) | | |
|---|---|---|---|---|---|---|
| | 1969 | 1970 | 1971 | 1969 | 1970 | 1971 |
| 1. මූලික ද්‍රවශීල වත්කම් | | | | | | |
| (අ) නෝට්ටු හා කාසි .. | 1,083·9 | 935·1 | 1,115·9* | 10·1 | 8·0 | 9·4 |
| (ආ) ඉල්ලුම් තැන්පතු .. | 799·2 | 1,031·5 | 1,033·8 | 7·4 | 8·9 | 8·7 |
| එකතුව .. | 1,883·1 | 1,966·6 | 2,149·7* | 17·5 | 16·9 | 18·2 |
| වෙනසෙහි සියයට ගණන .. | — 1·6 | + 4·4 | + 9·3 | | | |
| 2. ද්විතීයික ද්‍රවශීල වත්කම් | | | | | | |
| (අ) වෙළෙඳ බැංකු වෙතැති ඉතුරුම් තැන්පතු .. | 375·1 | 534·4 | 614·4 | 3·5 | 4·6 | 5·2 |
| (ආ) තැපැල් කන්තෝරු ඉතිරි කිරීමේ බැංකුව වෙතැති ඉතුරුම් තැන්පතු .. | 490·5 | 594·4 | 608·8* | 4·6 | 5·1 | 5·1 |
| (ඇ) ලංකා ඉතිරි කිරීමේ බැංකුව වෙතැති ඉතුරුම් තැන්පතු .. | 102·4 | 113·3 | 188·4* | 0·9 | 1·0 | 1·6 |
| (ඈ) වෙළඳ බැංකු වෙතැති කාලීන තැන්පතු .. | 594·3 | 613·8 | 671·4 | 5·5 | 5·3 | 5·7 |
| (ඉ) මෙරට නේවාසිකයන් සතු විදේශීය ශේෂ .. | — | — | — | — | — | — |
| (ඊ) ඉතුරුම් සහතික පත් .. | 86·3 | 73·1 | 66·0* | 0·8 | 0·6 | 0·6 |
| (උ) භාණ්ඩාගාර බිල්පත් .. | 15·4 | 12·7 | 13·3 | 0·1 | 0·1 | 0·1 |
| (ඌ) බදු සංචිත සහතික පත් .. | 15·8 | 43·5 | 53·1 | 0·1 | 0·4 | 0·4 |
| (එ) රජයේ පිළිනපත් .. | 937·4 | 1,024·2 | 1,148·7 | 8·7 | 8·8 | 9·7 |
| එකතුව .. | 2,617·2 | 3,009·4 | 3,364·1* | 24·3 | 25·9 | 28·4 |
| වෙනසෙහි සියයට ගණන .. | + 9·6 | + 15·0 | + 11·8 | | | |
| 3. පෞද්ගලික අංශයේ මුළු ද්‍රවශීල වත්කම් .. | 4,500·3 | 4,976·0 | 5,513·8* | 41·9 | 42·8 | 46·6 |
| වෙනසෙහි සියයට ගණන .. | + 4·7 | + 10·6 | + 10·8 | | | |
| තැපැල් කන්තෝරු ඉතිරි කිරීමේ බැංකුව, ලංකා ඉතිරිකිරීමේ බැංකුව, සේවක අර්ථ සාධක අරමුදල ආදි රජයේ මූල්‍ය ආයතන වෙතවූ භාණ්ඩාගාර බිල් පත් සහ රජයේ පිළිනපත් ඉහතින් දක්වා ඇති සංඛ්‍යාවන්ට ඇතුළත් කොට නොමැත. .. | 2,026·5 | 2,168·9 | 2,735·6 | 18·8 | 18·7 | 23·1 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) පවත්නා සාධක වියදම් මිල.

* තාවකාලිකය.

විමූල්‍යනය මගින් ව්‍යවහාර මුදල් නිකුතුවෙහි ඉහළ වටිනාකම ඇති කොටස් අනුපාතයෙහි ඇති කරන ලද තියුණු අඩුවීම කෙරේ ඉකුත් වර්ෂයේ වාර්ෂික වාර්තාවෙහිද අවධානය යොමු කරන ලදී. කෙසේ වුවද 1970 අවසානයේදී මුළු නෝට්ටු නිකුතුවෙන් රුපියල් 100 හා 50 නෝට්ටු අනුපාතය සියයට 47·0 ක් වූ අතර එය 1971 අවසානයේදී සියයට 57·1 ක් දක්වා ක්‍රමයෙන් වැඩිවිය.

මුදල් සැපයුමෙහි සංයුතිය හා ව්‍යවහාර මුදල් සංයුතිය II (ඇ) 4 හා II (ඇ) 5 සටහන් මගින් පැහැදිලි වේ.

## II (ඇ) 4 සංඛ්‍යා සටහන
## මුදල් සැපයුමෙහි සැකසුම

රුපියල් දශලක්ෂ වලිනි

| කාලච්ඡේදය අවසානයේදී | මහජනයා වෙතැති ව්‍යවහාර මුදල් | | මහජනයා සතු ඉල්ලුම් තැන්පතු | | මුළු මුදල් සැපයුම |
|---|---|---|---|---|---|
| | ප්‍රමාණය | මුළු මුදල් සැපයුමෙහි ප්‍රතිශතයක් වශයෙන් | ප්‍රමාණය | මුළු මුදල් සැපයුමෙහි ප්‍රතිශතයක් වශයෙන් | |
| 1958 | 529·8 | 49·2 | 546·9 | 50·8 | 1,076·8 |
| 1959 | 565·0 | 48·0 | 612·7 | 52·0 | 1,177·7 |
| 1960 | 595·3 | 49·2 | 613·6 | 50·8 | 1,208·9 |
| 1961 | 692·2 | 53·8 | 596·4 | 46·2 | 1,288·6 |
| 1962 | 712·6 | 53·1 | 630·0 | 46·9 | 1,342·7 |
| 1963 | 828·4 | 55·0 | 677·7 | 45·0 | 1,506·0 |
| 1964 | 853·0 | 52·6 | 768·8 | 47·4 | 1,621·8 |
| 1965 | 901·4 | 52·5 | 814·3 | 47·5 | 1,715·7 |
| 1966 | 882·5 | 53·2 | 776·4 | 46·8 | 1,658·9 |
| 1967 | 979·9 | 54·2 | 827·7 | 45·8 | 1,807·6 |
| 1968 | 1,066·2 | 55·7 | 847 0 | 44·3 | 1,913·2 |
| 1969 | 1,083·9 | 57·6 | 799·2 | 42·4 | 1,883·1 |
| 1970 | 935·1 | 47 6 | 1,031·5 | 52·4 | 1,966·6 |
| 1971 | 1,115·9* | 51·9* | 1,033·8 | 48·1 | 2,149·7* |

* තාවකාලිකය.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

## II (ඇ) 5 සංඛ්‍යා සටහන
## රුපියල් 100, 50, 10 සහ 5 හේ වටිනාකම අනුව ව්‍යවහාර මුදල් සංයුතිය

රුපියල් දශ ලක්ෂ

| කාලච්ඡේදය අවසානයේදී | රු: 100 | රු: 50 | රු: 10 | රු: 5 | ව්‍යවහාර මුදල් නිකුතුව* |
|---|---|---|---|---|---|
| 1957 .. | 116·5 | 116·7 | 155 8 | 29·9 | 475·1 |
| 1958 .. | 157·5 | 143·6 | 184 0 | 33·7 | 578·3 |
| 1959 .. | 174·5 | 152·1 | 193·5 | 36·2 | 621·3 |
| 1960 .. | 148·4 | 148·4 | 237·6 | 40·1 | 644·6 |
| 1961 .. | 211·9 | 180·3 | 254·6 | 42·1 | 763·8 |
| 1962 .. | 238·2 | 186·8 | 241·9 | 42·8 | 789·4 |
| 1963 .. | 275·3 | 236·7 | 257·6 | 46·5 | 900·9 |
| 1964 .. | 168·4 | 258·3 | 359·5 | 55·5 | 932·1 |
| 1965 .. | 239·9 | 297·8 | 319·7 | 50·5 | 1,002·8 |
| 1966 .. | 272·0 | 292·9 | 288·2 | 48·6 | 993·7 |
| 1967 .. | 316·2 | 313·1 | 296·3 | 51·3 | 1,072·8 |
| 1968 .. | 393·7 | 330·6 | 299·5 | 55·3 | 1,181·9 |
| 1969 .. | 435·7 | 322·9 | 293·7 | 54·1 | 1,212·7 |
| 1970 .. | 252·0 | 261·0 | 384·4 | 71·4 | 1,090·4 |
| 1971 .. | 421·1 | 312·9 | 353·1 | 70·7 | 1,285·1 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව;

* රුපියල් 2 සහ රුපියල් 1 වටිනාකම සඳහන් නෝට්ටු හා කාසි සියල්ලම අඩංගු වෙයි.

ව්‍යාපාරික අංශයේ තැන්පතුවල වැඩිවීමත් එය ව්‍යාපාරික නොවන අංශයේ තැන්පතුවල අඩුවීමක් මගින් තරමක් සමහන් කරලීමත් 1971 ඉල්ලුම් තැන්පතු වෙනස්වීම්වල ලක්ෂණයවූ බව II (ඈ) 6 සටහනින් දක්වේ. 1970 දී වූ රුපියල් දශලක්ෂ 26·6 ක වැඩිවීම හා සසඳන කල්හි ව්‍යාපාරික අංශයෙහි නිෂ්පාදන ආයතනයන්හි ඉල්ලුම් තැන්පතු රුපියල් දශලක්ෂ 39·7 කින් සැලකිය යුතු ලෙස වැඩිවිණි. 1970 අවසානයේදී මුළු තැන්පතු සඳහාවූ ඒවායේ කොටස් අනුපාතය සියයට 10·0 ක සිට 1971 අවසානයේදී සියයට 13·9 දක්වා ඉහළ ගියේය. අනිත් අතට 1970 දී වෙළඳ ආයතනයන්හි ඉල්ලුම් තැන්පතු රුපියල් දශලක්ෂ 76·6 ක වැඩිවීම හා සසඳන කල්හි 1971 දී ඒවා රුපියල් දශලක්ෂ 38·6 කින් පැහැදිලි අඩුවීමක් පෙන්නුම් කළේය. එහි ප්‍රතිඵලයක් වශයෙන් 1970 අවසානයේදී මුළු තැන්පතු සඳහාවූ ඒවායේ කොටස සියයට 18·8 සිට 1971 අවසානයේදී සියයට 14·8 දක්වා පහත වැටුණි. 1971 දී මූල්‍ය ආයතනයන්හි හා "අනෙකුත් ව්‍යාපාරික" අංශයන්හි ඉල්ලුම් තැන්පතු පිළිවෙලින් රුපියල් දශලක්ෂ 2·9 කින් හා රුපියල් දශලක්ෂ 9·1 කින් වැඩිවිය. එහෙත් ඉකුත් වර්ෂයෙහිවූ වැඩිවීම් පිළිවෙලින් රුපියල් දශලක්ෂ 14·2 ක් හා රුපියල් දශලක්ෂ 25·5 ක් විය. 1970 දී රුපියල් දශලක්ෂ 6·7 කින් අඩුවූ වැවිලි අංශය සතු ඉල්ලුම් තැන්පතු 1971 දී රුපියල් දශලක්ෂ 4·4 කින් ඉහළ ගියේය. 1970 හි වැඩිවීමවූ රුපියල් දශලක්ෂ 1·1 ක් සමග සසඳන කල්හි පළාත් පාලන මණ්ඩලයන් සතු ඉල්ලුම් තැන්පතුවල රුපියල් දශලක්ෂ 14·5 ක සැලකිය යුතු වැඩිවීමක් සටහන් විය. මේ අතර පුද්ගලික හා ව්‍යාපාරික නොවන ආයතනයන්හි ඉල්ලුම් තැන්පතු පිළිවෙලින් රුපියල් දශලක්ෂ 22·3 කින් හා රුපියල් දශලක්ෂ 0·9 කින් පහත වැටුණි. ඉකුත් වර්ෂයෙහි පෞද්ගලික තැන්පතුවලවූ රුපියල් දශලක්ෂ 74·7 ක වැඩිවීමක් හා සසඳන කළ 1971 දී පෞද්ගලික තැන්පතුවල අඩුවීම සැලකිය යුතු එකකි මුළු ඉල්ලුම් තැන්පතුවලින් ඒවායේ කොටස් අනුපාතය 1970 අවසානයේදී සියයට 41·0 ක සිට 1971 අවසානයේදී සියයට 38·4 දක්වා අඩුවිය.

බැංකු නොවන පුද්ගලික අංශයේ ද්විතියික ද්‍රවශීල වත්කම්හිවූ වැඩිවීමෙන් සියයට 40 ක්ම වාගේ වාණිජ බැංකුවල කාලීන හා ඉතුරුම් තැන්පතුවලින් සමන්විත විය. 1970 දී කාලීන හා ඉතුරුම් තැන්පතුවල වැඩිවීම රුපියල් දශලක්ෂ 10·5 ක්වූ අතර 1971 දී එය රුපියල් දශලක්ෂ 12·5 ක් විය. විමුල්‍යනයෙහි ප්‍රතිඵලයක් වශයෙන් 1970 දී වෙළඳ බැංකුවල ඉතුරුම් තැන්පතු රුපියල් දශ ලක්ෂ 164·1 කින් විශාල ලෙස වැඩි වූයේ 1971 දී එය රුපියල් දශලක්ෂ 78·8 කින් වැඩි විය. 1971 දී වෙළඳ බැංකු වෙතැති කාලීන තැන්පතු වැඩිවීමට මූලික වූයේ පෞද්ගලික තැන්පතුවල ඇති වූ වැඩිවීමයි. 1969 දී වූ රුපියල් දශලක්ෂ 0·6 ක වැඩිවීම හා 1970 දී වූ රුපියල් දශලක්ෂ 11·2 ක වැඩිවීම හා සසඳන කල්හි 1971 දී මෙම තැන්පතු රුපියල් දශලක්ෂ 27·8 කින් වැඩිවී ඇත. "අනෙකුත් ව්‍යාපාරික" ආයතනයන්හි කාලීන තැන්පතුවල ද රුපියල් දශලක්ෂ 18·6 ක සැලකිය යුතු වැඩිවීමක් ඇති වූ අතර, වෙළඳ ආයතනයන්හි කාලීන තැන්පතු රුපියල් දශලක්ෂ 7·6 කින් ඉහළ ගියේ ය. 1971 වර්ෂයේ දී අනිකුත් සියලුම වර්ගවල කාලීන තැන්පතු අඩුවීමක් දක්නට ලැබුණි.

1971 ද්විතියික ද්‍රවශීල වත්කම්හි වර්ධනය ගැන සලකා බලන කල්හි වැදගත් ලක්ෂණයක් වනුයේ ලංකා ඉතිරි කිරීමේ බැංකු තැන්පතුවල ඇතිවූ සැලකිය යුතු වැඩිවීමයි. 1970 දක්වා මෙම තැන්පතුවල වර්ධනය ඉතා සුළු වූ අතර, කිසිම වර්ෂයක දී එම වැඩිවීම රුපියල් දශලක්ෂ 10 නො ඉක්මවී ය. එහෙත්, 1971 දී එහි වැඩිවීම රුපියල් දශලක්ෂ 75·1 ක ප්‍රමාණයක් විය. 1971 ජනවාරි මස සිට ක්‍රියාත්මක වූ පරිදි තැපැල් කන්තෝරු ඉතිරි කිරීම් සඳහා වූ පොළී ප්‍රමාණයන් සැලකිය යුතු ලෙස ඉහළ දමනු ලැබුව ද, එහි තැන්පතුවල වැඩිවීම, සාපේක්ෂව සැලකිය යුතු නොවන තරම් විය. තැන්පතුකරුවන්, ආදායමට වඩා තැන්පතුවල ඇති ද්‍රවශීලතාවය කෙරේ වරණයක් දක්වතැයි ඒ අනුව සිතිය හැක. විමුල්‍යනයෙහි ප්‍රතිඵලයක් වශයෙන් පෙර නො වූ විරූ පරිදි 1970 දී තැපැල් කන්තෝරු ඉතුරුම් බැංකුවල තැන්පතු

## II (ඈ) 6 සංඛ්‍යා සටහන

### වෙළඳ බැංකු වෙතැති පෞද්ගලික අංශයේ ඉල්ලුම්, කාලීන හා ඉතුරුම් තැන්පතු අයිතිය
### (කාලච්ඡේදය අවසානයේදී)

රුපියල් දශලක්ෂ වලිනි.

| අයිතිය | ඉල්ලුම් | | කාලීන | | ඉතුරුම් | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය | % | ප්‍රමාණය | % | ප්‍රමාණය | % | ප්‍රමාණය | % |
| **මූල්‍ය ආයතන** | | | | | | | | |
| 1970 දෙසැම්බර් .. | 56·1 | 5·7 | 135·3 | 24·0 | 16·3 | 3·0 | 207·7 | 10·0 |
| 1971 මාර්තු .. | 55·1 | 5·7 | 131·5 | 23·3 | 18·7 | 3·4 | 205·3 | 9·9 |
| 1971 ජුනි .. | 55·9 | 5·8 | 131·0 | 24·0 | 18·3 | 3·2 | 205·3 | 9·9 |
| 1971 සැප්තැම්බර් .. | 47·8 | 4·9 | 126·6 | 22·3 | 18·1 | 3·1 | 192·5 | 9·1 |
| 1971 දෙසැම්බර් .. | 59·0 | 5·9 | 123·1 | 21·4 | 18·8 | 3·1 | 200·9 | 9·2 |
| **වැවිලි** | | | | | | | | |
| 1970 දෙසැම්බර් .. | 56·8 | 5·8 | 42·1 | 7·5 | 0·3 | 0·1 | 99·2 | 4·8 |
| 1971 මාර්තු .. | 89·1 | 9·2 | 42·8 | 7·6 | 0·4 | 0·1 | 132·3 | 6·4 |
| 1971 ජුනි .. | 64·4 | 6·7 | 37·5 | 6·9 | 0·4 | 0·1 | 102·3 | 4·9 |
| 1971 සැප්තැම්බර් .. | 66·8 | 6·9 | 30·4 | 5·4 | 0·2 | ... | 97·4 | 4·6 |
| 1971 දෙසැම්බර් .. | 61·2 | 6·2 | 30·4 | 5·3 | 0·5 | 0·1 | 92·2 | 4·2 |
| **වෙළෙඳ** | | | | | | | | |
| 1970 දෙසැම්බර් .. | 185·1 | 18·8 | 94·6 | 16·8 | 6·4 | 1·2 | 286·1 | 13·7 |
| 1971 මාර්තු .. | 172·7 | 17·9 | 97·4 | 17·2 | 7·2 | 1·3 | 277·3 | 13·3 |
| 1971 ජුනි .. | 176·8 | 18·4 | 97·9 | 17·9 | 8·1 | 1·4 | 282·9 | 13·6 |
| 1971 සැප්තැම්බර් .. | 150·8 | 15·6 | 119·7 | 21·1 | 8·6 | 1·5 | 279·1 | 13·2 |
| 1971 දෙසැම්බර් .. | 146·5 | 14·8 | 102·2 | 17·8 | 9·9 | 1·6 | 258·7 | 11·9 |
| **නිෂ්පාදන ආයතන** | | | | | | | | |
| 1970 දෙසැම්බර් .. | 98·9 | 10·0 | 41·7 | 7·4 | 0·4 | 0·1 | 141·0 | 6·8 |
| 1971 මාර්තු .. | 109·7 | 11·3 | 39·8 | 7·0 | 0·2 | ... | 149·8 | 7·2 |
| 1971 ජුනි .. | 98·3 | 10·2 | 24·3 | 4·5 | 0·1 | ... | 122·6 | 5·9 |
| 1971 සැප්තැම්බර් .. | 116·8 | 12·0 | 30·5 | 5·4 | 0·5 | ... | 147·8 | 7·0 |
| 1971 දෙසැම්බර් .. | 138·6 | 13·9 | 32·0 | 5·6 | 3·0 | 0·5 | 173·6 | 8·0 |
| **අනෙකුත් ව්‍යාපාර** | | | | | | | | |
| 1970 දෙසැම්බර් .. | 107·0 | 10·9 | 50·7 | 9·0 | 8·2 | 1·5 | 165·9 | 8·0 |
| 1971 මාර්තු .. | 109·1 | 11·3 | 54·7 | 9·7 | 8·8 | 1·6 | 172·5 | 8·3 |
| 1971 ජුනි .. | 110·9 | 11·5 | 49·2 | 9·0 | 11·0 | 1·9 | 171·1 | 8·2 |
| 1971 සැප්තැම්බර් .. | 126·8 | 13·1 | 55·4 | 9·8 | 7·2 | 1·2 | 189·4 | 9·0 |
| 1971 දෙසැම්බර් .. | 116·1 | 11·7 | 69·3 | 12·0 | 9·6 | 1·6 | 195·0 | 8·9 |
| **ප්‍රාදේශීය බලමණ්ඩල** | | | | | | | | |
| 1970 දෙසැම්බර් .. | 16·9 | 1·7 | 12·2 | 2·2 | 0·2 | ... | 29·3 | 1·4 |
| 1971 මාර්තු .. | 18·4 | 1·9 | 12·1 | 2·1 | 0·2 | ... | 30·8 | 1·5 |
| 1971 ජුනි .. | 21·3 | 2·2 | 12·4 | 2·3 | 0·2 | ... | 33·9 | 1·6 |
| 1971 සැප්තැම්බර් .. | 26·2 | 2·7 | 12·3 | 2·2 | 0·3 | ... | 38·8 | 1·8 |
| 1971 දෙසැම්බර් .. | 31·4 | 3·2 | 11·7 | 2·0 | 0·3 | ... | 43·4 | 2·0 |
| **ව්‍යාපාර නොවන ආයතන** | | | | | | | | |
| 1970 දෙසැම්බර් .. | 59·7 | 6·1 | 54·2 | 9·6 | 7·8 | 1·5 | 121·7 | 5·8 |
| 1971 මාර්තු .. | 58·1 | 6·0 | 53·2 | 9·4 | 5·7 | 1·4 | 118·8 | 5·7 |
| 1971 ජුනි .. | 61·6 | 6·4 | 55·8 | 10·2 | 7·7 | 1·3 | 125·0 | 6·0 |
| 1971 සැප්තැම්බර් .. | 62·1 | 6·4 | 46·1 | 8·1 | 7·3 | 1·3 | 115·6 | 5·5 |
| 1971 දෙසැම්බර් .. | 58·8 | 5·9 | 46·6 | 8·1 | 8·2 | 1·3 | 113·6 | 5·2 |
| **පුද්ගලයන්** | | | | | | | | |
| 1970 දෙසැම්බර් .. | 403·6 | 41·0 | 132·4 | 23·5 | 496·0 | 92·6 | 1,032·0 | 49·5 |
| 1971 මාර්තු .. | 354·2 | 36·6 | 133·2 | 23·6 | 503·5 | 92·1 | 991·0 | 47·7 |
| 1971 ජුනි .. | 373·4 | 38·8 | 137·2 | 25·2 | 526·4 | 92·0 | 1,037·1 | 49·9 |
| 1971 සැප්තැම්බර් .. | 372·4 | 38·4 | 146·3 | 25·8 | 534·3 | 92·7 | 1,053·1 | 49·8 |
| 1971 දෙසැම්බර් .. | 381·3 | 38·4 | 160·2 | 27·8 | 564·0 | 91·8 | 1,105·5 | 50·6 |
| **එකතුව** | | | | | | | | |
| 1970 දෙසැම්බර් .. | 984·1 | 100·0 | 563·1 | 100·0 | 535·6 | 100·0 | 2,082·8 | 100·0 |
| 1971 මාර්තු .. | 966·5 | 100·0 | 564·9 | 100·0 | 546·5 | 100·0 | 2,077·9 | 100·0 |
| 1971 ජුනි .. | 962·6 | 100·0 | 545·3 | 100·0 | 572·2 | 100·0 | 2,080·1 | 100·0 |
| 1971 සැප්තැම්බර් .. | 969·7 | 100·0 | 567·3 | 100·0 | 576·5 | 100·0 | 2,113·7 | 100·0 |
| 1971 දෙසැම්බර් .. | 993·0 | 100·0 | 575·6 | 100·0 | 614·4 | 100·0 | 2,183·0 | 100·0 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

රුපියල් දශලක්ෂ 104 දක්වා ඉහළ ගියේ ය. එයට ප්‍රධාන හේතුව වූයේ ලංකා ඉතිරි කිරීම් බැංකුව හා වෙළඳ බැංකුවලට වඩා තැපැල් කන්තෝරු ඉතිරි කිරීමේ බැංකුව භූගෝලීය වශයෙන් වඩා පුළුල් ලෙස පැතිරී තිබීම ය. 1971 ජනවාරි මස සිට ක්‍රියාත්මක වන පරිදි තැන්පතු සඳහා ගෙවන ලද පොලිය සියයට 3·6 සිට සියයට 7·2 දක්වා දෙගුණයකින් ඉහළ නංවන ලදී. (එසේම ලංකා ඉතිරි කිරීමේ බැංකුව විසින් ගෙවන පොළී ප්‍රමාණය ද සියයට 4 සිට සියයට 7 දක්වා ඉහළ නංවන ලදී.)

1971 දී තැපැල් කන්තෝරු ඉතිරි කිරීමේ බැංකු පොලිය සැලකිය යුතු ලෙස ඉහළ දැමීම විමුල්‍යනය නිසා එකතු වූ තැන්පතු ප්‍රමාණය එසේම පවත්වා ගැනීමට ආධාර වූ නමුත් තැන්පතු පරිමාවෙහි සැලකිය යුතු වැඩිවීමක් ඇති කිරීමට සමත් නො වුණි. අනික් අතට වෙළඳ බැංකු විසින් ඉතුරුම් තැන්පතු සඳහා ගෙවනු ලබන පොලිය සියයට 4½ වූ නමුත් තැපැල් කන්තෝරු ඉතිරි කිරීමේ බැංකුවෙහි ඉතුරුම් තැන්පතු වැඩිවීම වූ රුපියල් දශලක්ෂ 14 සමග සසඳන කල වෙළඳ බැංකු එහි ඉතුරුම් තැන්පතු ප්‍රමාණය රුපියල් දශලක්ෂ 80 ක ප්‍රමාණයක් දක්වා සැලකිය යුතු අන්දමින් වැඩි කර ගැනීමට සමත් වී ඇත. ඒ අනුව බැංකුවෙහි දුර්වල ක්‍රියාකාරිත්වය කෙරෙහි, තැන්පතු ආපසු ගැනීමේ දී ඇති දැඩි නීතිරීති හේතුවෙන් එම තැන්පතුවල අඩු ද්‍රවශීලතාවය හේතු වී යයි සිතිය හැක. තැන්පතුකරුවන් ආදායම් ඉපැයීමට වඩා ද්‍රවශීලතාවය කෙරෙහි වැඩි වරණයක් දක්වා ඇති අතර ඔවුහු ඉහළ ආදායමක් උපයා ගැනීමේ වාසිය ද ලබා ගත් බව ලංකා ඉතිරි කිරීමේ බැංකුවෙහි තැන්පතු සැහෙන අන්දමින් වැඩිවී තිබීමෙන් පැහැදිළි වෙයි. ලංකා ඉතිරි කිරීමේ බැංකුවෙහි තැන්පතු ආපසු ගැනීම් එතරම් දැඩි නොවේ. මෙම බැංකුවෙහි තැන්පතු, භූගෝලීය වශයෙන් එහි ව්‍යාප්තිය සීමා නො වන්නට තවදුරටත් වැඩි වන්නට ඉඩ තිබිණැයි කිව හැකි ය. මෙම කරුණු අනුව, ඒ ඒ ආයතනයන්හි පොළී ප්‍රමාණයන් ඉහළ දැමීම පමණක් ඉතුරුම් සංචලතාව කෙරෙහි එතරම් බලපා ඇති බවක් අවධාරණය නො කෙරෙයි. තැන්පතුවල ද්‍රවශීලතාව තැන්පතුකරුවන් කෙරෙහි බෙහෙවින් බලපා ඇති බව පෙනේ. මහජනයා සතු ඉතුරුම් සහතික පත්වල වටිනාකම තවදුරටත් අඩුවෙමින් පවතියි. එය සමහර විට ඉතුරුම් සහතික පත් පොලිය, තැපැල් කන්තෝරු ඉතිරි කිරීමේ බැංකුව හා ලංකා ඉතිරි කිරීමේ බැංකුව තැන්පතු සඳහා ගෙවන පොළී ප්‍රමාණයන් සමග සංශෝධනය නො කිරීම හේතුවී යයි සිතිය හැක.

පසුගිය අවුරුදු දෙක තුළදී රජය මත පුද්ගලික අංශයේ හිමිකම් සැලකිය යුතු අන්දමින් වැඩිවීම වැදගත් ලක්ෂණයක් විය. 1970 දී භාණ්ඩාගාර බිල්පත්, බදු සංචිත සහතික පත් සහ රජයේ පිළිත පත් දැරීම් එකතුව රුපියල් දශලක්ෂ 111·8 කින් වැඩිවූ අතර ඒවා 1969 දී වැඩිවී තිබුණේ රුපියල් දශලක්ෂ 58·9 කිනි. 1971 දී මුළු දැරීම්හි වැඩිවීම රුපියල් දශලක්ෂ 134·7 ක ප්‍රමාණයක් විය. භාණ්ඩාගාර බිල්පත් දැරීම්හි වැඩිවීම රුපියල් දශලක්ෂ 0·6 ක් තරම් නො සැලකිය යුතු ප්‍රමාණයක් විය. මේ අතර රජයේ පිළිත පත් දැරීම් සහ බදු සංචිත සහතික පත් පිළිවෙලින් රුපියල් දශලක්ෂ 124·5 කින් සහ රුපියල් දශලක්ෂ 9·6 කින් වැඩිවිය. 1970 දී වූ රුපියල් දශලක්ෂ 86·8 ක වැඩිවීමත් සමග සසඳන කළ 1971 දී රජයේ පිළිතපත්හි වූ වැඩිවීම රුපියල් දශලක්ෂ124·5 ක් විය. රක්ෂණ සංස්ථාවෙහි වූ රජයේ පිළිතපත් දැරීම රුපියල් දශලක්ෂ 65·1 කින් වැඩිවූ අතර එය, පෞද්ගලික අංශය වෙතැති රජයේ මුළු පිළිතපත් පරිමාවෙහි වැඩිවීමෙන් භාගයකටත් වඩා වැඩි ප්‍රමාණයක් විය. 1970 දී සංස්ථාවේ පිළිතපත් දැරීම්හි වැඩිවීම රුපියල් දශලක්ෂ 45·9 ක් විය. 1970 හි වූ රුපියල් දශලක්ෂ 38·2 හා සසඳන කල්හි 1971 දී භාරකාර, සුභසාධක, විශ්‍රාම සහ අර්ථසාධක අරමුදල් හි (සේවක අර්ථසාධක අරමුදල හැර) රාජ්‍ය පිළිතපත් දැරීමේ රුපියල් දශලක්ෂ 60·1 කින් වැඩිවිය. අනෙකුත් අය සතුවූ ප්‍රමාණයන් රුපියල්දශලක්ෂ 0·7 කින් අඩුවිත.

සාරාංශ වශයෙන් දක්වන කල්හි මෑත වර්ෂවලදී බැංකු නො වන පෞද්ගලික අංශයන්හි ද්විතියික ද්‍රවශීල වත්කම්හි සැලකිය යුතු වර්ධනයක් සිදුවිය. එය 1970 දී හා 1971 දී වඩාත් පැහැදිලිව දක්නට තිබුණි. මේ වර්ෂ දෙකේදී කැපී පෙනෙන ලක්ෂණය වූයේ පෞද්ගලික අංශයේ මුළු ද්විතීයික ද්‍රවශීල වත්කම් තුළ රජය මතවූ හිමිකම් කොටස් අනුපාතයෙහිවූ

වැඩිවීමයි. මුළු ද්විතීයික ද්‍රවශීල වත්කම්වලින් රජය මතවූ හිමිකම් අනුපාතයෙහිවූ වැඩිවීම් පිළිවෙලින් 1969 දී සියයට 25·6 ක් ද, 1970 දී සියයට 28·5 ක් ද වූ අතර, 1971 දී සියයට 38·2 ක් දක්වා වැඩිවිය. කෙසේ වෙතත් රාජ්‍ය හිමිකම් දැරීම් මුළුමනින්ම වාගේ ආයතනික ආයෝජකයන් සතුව තවදුරටත් පැවතිණි. බැංකු නොවන පෞද්ගලික අංශයේ මූල්‍ය වත්කම් සියල්ලම ගත් විට, දළ ජාතික නිෂ්පාදිතය සඳහා එම වත්කම්වල අනුපාතය 1970 දී සියයට 42·8 ක් වූ අතර 1971 දී එය සියයට 46·6 ක් විය.

1. (ඇ) පොළී අනුපාතිකයන්

1971 වර්ෂය තුළදී මහ බැංකු පොළී ප්‍රමාණය සියයට 6½ ක්ව නොවෙනස්ව පැවතිණි. වෙළඳ හා නිෂ්පාදන ණය සම්බන්ධයෙන් භාවිතීය පොරොන්දු නෝට්ටු මත දෙනු ලබන අත්තිකාරම් සඳහා වූ මහ බැංකුවේ පොළී ප්‍රමාණය ද සියයට 6½ ක්ව නොවෙනස්ව පැවැති බව පෙනේ. මැදි හා දිගුකාලීන ණය අරමුදලින් දෙන ලද මහ බැංකුවේ ප්‍රතිමූල්‍ය ණය පහසුකම් සම්බන්ධයෙන් වූ පොළී අනුපාතිකයන්හි පහත දැක්වෙන වෙනස හැර අනිකුත් වෙනසක් දක්නට නොවීය. තේ කර්මාන්ත ශාලා නවීකරණයට සහ/හෝ නව තේ කර්මාන්ත ශාලා ගොඩනැංවීම සඳහා දෙනලද ප්‍රතිමූල්‍ය ණය සඳහා වූ අනුපාතිකයන්, දේශීය වියදම් පියවා ගැනීමට දෙන ප්‍රතිමූල්‍ය ණය සඳහා සියයට 5 සිට සියයට 6 දක්වාත්, විදේශීය විනිමය වියදම් පියවා ගැනීමට දෙන ප්‍රතිමූල්‍ය ණය සඳහා සියයට 7 සිට සියයට 8 දක්වාත් ජනවාරි මාසයේදී වැඩි කරන ලදී. කර්මාන්ත හා කෘෂිකාර්මික සංවර්ධනය හෝ නැංවීම සහ වෙළඳම, වාණිජ හෝ ව්‍යාපාර කටයුතු සංවර්ධනය හෝ නැංවීම සඳහා වූ ප්‍රතිමූල්‍ය ණය අනුපාතිකය පිළිවෙලින් සියයට 6½ සහ සියයට 7½ ක් හැටියට තවදුරටත් එසේම පැවතිණි. කෘෂිකාර්මික ණය ක්‍රමය යටතේ වූ මහ බැංකුවේ ප්‍රතිමූල්‍ය අනුපාතිකය සියයට 1½ ක්ව පැවතිණි. දේශීයව වගා කරන ලද කෘෂිකාර්මික නිෂ්පාදිතයන් මිළදී ගැනීමට, විකිණීමට හෝ ගබඩා කිරීමටත්, සහතික මිළ ක්‍රමය යටතේ වී මිළදී ගැනීමටත් මුදල් යෙදවීම සඳහා සමුපකාරයන්ට දෙන වාණිජ බැංකු අත්තිකාරම් සම්බන්ධයෙන් වූ පොළී අනුපාතිකය සියයට 3 ක්ව එලෙසම පැවතිණි.

1971 ජූලි මාසයේදී සියයට 4½ සිට සියයට 5 දක්වා අන්තර්-බැංකු ඒක්ෂණ ණය අනුපාතිකයෙහි සිදුවූ වෙනස හැර, වෙළඳ බැංකු ණයදෙන අනුපාතිකයන්ගේ වෙනස්වීමක් නොවීය. මිළදී ගත් බිල්පත් සඳහා වූ උපරිම සහ අවම අනුපාතිකයන් පිළිවෙලින් සියයට 10 ක් සහ සියයට 6½ ක් ලෙස තවදුරටත් නොවෙනස්ව පැවතිණ. රජයේ සුරැකුම්පත් සහ බද්ධ ව්‍යාපාර වස්තු සමාගම් කොටස් මත දෙන ලද අත්තිකාරම් සඳහා වූ උපරිම සහ අවම පොළී අනුපාතිකයන්ද පිළිවෙලින් සියයට 9⅓ හා සියයට 6½ ක්ද, සියයට 11 හා සියයට 9 ක් ද වශයෙන් නොවෙනස්ව පැවැතිණ. වෙළඳ තොග ඇපයට තබාගෙන දෙනලද අත්තිකාරම් සම්බන්ධයෙන් ඒවායේ උපරිම අනුපාතිකය සියයට 12 ක්ද, අවම අනුපාතිකය සියයට 8½ ක් ද විය. මේ අතර, නිශ්චල දේපළ ඇපකොට ගත් ණය සඳහා වූ උපරිම හා අවම අනුපාතිකයන් පිළිවෙලින් සියයට 11 සහ සියයට 8 ක්ව පැවති බව පෙනේ. අනිකුත් වර්ගයේ ඇප කොටස් සහ ඇප රහිත ණය වෙනුවෙන් අයකරන ලද උපරිම පොළී ප්‍රමාණය සියයට 12 ක්වූ අතර, ඒවා සඳහා වූ අවම අනුපාතිකයන් පිළිවෙලින් සියයට 6½ සහ සියයට 8½ ක් විය.

1971 වර්ෂය තුළදී වෙළඳ බැංකු තැන්පතු අනුපාතිකයන් ද තවදුරටත් නොවෙනස්ව පැවැතිණි. ඉතුරුම් තැන්පතු සඳහා වෙළඳ බැංකු මගින් ගෙවන ලද පොළී අනුපාතිකය සියයට 4½ ක් විය. කාලීන තැන්පතු වලදී රුපියල් 5,000 ට අඩු තැන්පතු සඳහා ගෙවන පොළී අනුපාතිකය ඒවායේ කල්පිරීම් අනුව සියයට 4½ සහ සියයට 5¼ අතර විචලනය විය. මේ අතර, රුපියල් 5,000 සහ රුපියල් 25,000 අතර තැන්පතු සඳහා වූ අනුපාතිකය සියයට 4¾ සහ සියයට 5½ අතර විචලනය විය. රුපියල් 25,000 සහ ඊට වැඩි තැන්පතු ප්‍රමාණයන් සඳහා වූ අනුපාතිකය සියයට 5 සහ 5¾ අතර වෙනස් විය. මේ අනුව වෙළඳ බැංකු වෙත වූ කාලීන තැන්පතු සඳහා ලබාගත හැකි වැඩිම පොළී අනුපාතිකය සියයට 5¾ ක්ව තවදුරටත් පැවතිණි

ජනවාරි මාසයේදී, තැපැල් කන්තෝරු ඉතිරි කිරීමේ බැංකුව සහ ලංකා ඉතිරි-කිරීමේ බැංකුව මගින් ජීවාංයේ ඉතුරුම් තැන්පතු සඳහා වූ අනුපාතිකයන් පිළිවෙලින් සියයට 3·6 සහ සියයට 4·0 සිට සියයට 7·2 සහ සියයට 7·0 දක්වා වැඩි කෙරිණි. ලංකා ඉතිරි කිරීමේ බැංකුව මගින් අවුරුද්දක කාලච්ඡේදයක් සඳහා වූ ස්ථාවර තැන්පතු වෙනුවෙන් ගෙවන පොලී අනුපාතිකයද සියයට 4½ සිට සියයට 7½ දක්වා වැඩි කරන ලදී.

මහ බැංකුවේ ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රමය යටතේ සපයන ලද අරමුදල් මගින් තේ කර්මාන්ත ශාලා නවීනකරණය හෝ ඉදිකිරීම සඳහා දෙන ලද ණය වෙනුවෙන් රජයේ උකස් බැංකුව මගින් අයකළ පොළී අනුපාතිකය පෙබරවාරි මාසයේදී සියයට 8½ සිට සියයට 9½ දක්වා ඉහළ න වන ලදී. සම්ප්‍රදායානුකූල නොවන කෘෂිකාර්මික අපනයන භාණ්ඩයන් (මහ බැංකු ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රමය යටතේ) වගා කිරීමට දෙන ලද ණය සඳහා වූ පොළී අනුපාතිකයද පෙබරවාරි මාසයේදී සියයට 8½ සිට සියයට 9½ දක්වා වැඩි කෙරිණි කිරිපට්ටි පාලනය, ඌරන් ඇතිකිරීම, බැටළුවන් සහ කුකුලන් ඇති කිරීම සඳහා, ඉඩම් ඇපකොට ගෙන (මහ බැංකු ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රමයෙන් බැහැරව) දෙන ලද ණය සඳහා වූ පොළී ප්‍රමාණය ජූනි මාසයේදී සියයට 10½ සිට සියයට 11½ දක්වා ඉහළ ගියේය. පුද්ගලික ඇපයන් මත දෙන ලද මෙම ණය සඳහා වූ අනුපාතිකය එම මාසය තුළදීම සියයට 11 සිට සියයට 12 දක්වා වැඩි විය. තවද ජූනි මාසයේදී, කෘෂිකර්ම සංවර්ධනය හෝ නැංවීම සඳහා දෙන ලද ණය සඳහා (මහ බැංකු ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රමයෙන් බැහැරව) අය කරන ලද පොළී අනුපාතිකය සියයට 10½ සිට සියයට 11½ දක්වා නැංවීය. නිවාස ඉදිකිරීම සහ අනිකුත් සංවර්ධන අරමුණු සඳහා දෙන ලද ණයවලට අයකළ අනුපාතිකයද පෙබරවාරි මාසයේදී සියයට 10 සිට සියයට 10½ දක්වාත්, ජූනි මාසයේදී සියයට 11½ දක්වාත් වැඩි කෙරිණි. අනෙකුත් හැම අනුපාතිකයක්ම 1971 වර්ෂය තුළදී නොවෙනස්ව පැවතිණි.

මෙම වර්ෂය තුළදී කෘෂිකාර්මික හා කාර්මික ණය දෙන සමායතනය මගින් දෙන ලද ණය සඳහා වූ පොළී අනුපාතිකයන්හි වෙනසක් නොවීය. සමායතන මගින් නිශ්චල දේපළ ඇපයට තබා ගනිමින් සංවර්ධන අරමුණු සඳහා දෙන ලද ණයවලට සියයට 9 ක පොළියක්ද, චංචල දේපළ ඇපයට ගනිමින් දෙන ණයවලට සියයට 10 ක පොළියක්ද අයකරන ලදී. සංවර්ධන නොවන අරමුණු සඳහා නිශ්චල දේපළ ඇපයට තබා ගනිමින් දෙන ණය සඳහා අයකරන ලද අනුපාතිකය සියයට 10 ක් වූ අතර, චංචල දේපළ ඇපයට තබා ගනිමින් ඒ සඳහා දෙන ණයවලට පොළිය සියයට 12 ක් විය. සංවර්ධන මූල්‍ය සමායතනය මගින් අයකරන ලද අනුපාතිකයන්ද සියයට 9½ සහ සියයට 10½ ක්ව නොවෙනස්ව පැවැතිණි. ලංකා ඉතිරිකිරීමේ බැංකුව මගින් ගොඩ-නැගිලි අරමුණු සඳහා දෙන ලද ණයවලට පොළී වශයෙන් සියයට 10 ක්ද, අනිකුත් අරමුණු සඳහා වූ ණය සම්බන්ධයෙන් සියයට 12 ක්ද අය කිරීම තවදුරටත් සිදු විය.

1970 දෙසැම්බර් මාසය තුළ භාණ්ඩාගාර බිල්පත් අනුපාතිකය සියයට 4·76 ක්ව පැවැති අතර, එය; 1971 ජූනි මාසයේදී සියයට 4·77 දක්වා ඉහළ යන තුරු නොවෙ-නස්ව පැවතිණ. ඉන්පසු ජූලි මාසයේදී එය සියයට 5·00 දක්වා වැඩිවී වර්ෂයේ ඉතිරි කාලය තුළදී එම මට්ටමෙහි නොවෙනස්ව තිබුණි. රජයේ සුරැකුම් පත් සඳහා වූ පොළී අනුපාතිකය සියයට 9 ක්ව පැවතිණි. එහෙත් 1970 දී අවුරුදු 5–7 සුරැකුම් පත් වෙනුවට 1971 දී අවුරුදු 10–12 සුරැකුම් පත් නිකුත් කරණ ලදී.

**2. (අ) වානිජ බැංකු කටයුතු – ප්‍රධාන උපනතීන්**

විමර්ශණයට භාජනය වූ වර්ෂය තුළදී මුදල් සැපයුමේ වූ වැඩිවීම සම්පූර්ණයෙන්ම පාහේ ව්‍යවහාර මුදල් ස්වරූපයෙන් විය. එය ඉල්ලුම් තැන්පතු වැඩිවීම තුළින් වෙළඳ බැංකුවලට එකතුවන සම්පත් කෙරෙහි හානිකර විය. කාලීන හා ඉතුරුම් තැන්පතුවල

වැඩිවීමද ඉකුත් වර්ෂයට වඩා අඩුවිය; එහෙත් 1970 වර්ෂය තුළදී මෙම තැන්පතුවල වූ වැඩිවීම, විමුල්‍යනය හේතුවෙන් අසාමාන්‍ය අයුරින් විශාලවීම මෙහිදී සැළකියයුතු කරුණකි. කෙසේවුවද තැන්පතුවල වූ අඩු වර්ධනය, බැංකු කෙරෙහි එතරම් බලපෑමක් ඇති නොකෙරිණි. ඊට හේතු වූයේ මෙම අවුරුද්ද තුළදී ඒවායේ සම්පත් කෙරෙහි අධිකතර ඉල්ලුමක් නොපැවතීමයි. මෙම තත්වය මුළු තැන්පතු සඳහා වූ ඉහළ ද්‍රවශීල වත්කම් අනුපාතයෙන්ද පැහැදිලි වෙයි ද්‍රවශීල වත්කම් අනුපාතයෙහි මාසික සාමාන්‍යය මෙම වර්ෂයේදී සියයට 36·0 ක් වූයේ, එය 1970 දී සියයට 30·8 ක් විය. මුළු තැන්පතු සඳහා වූ සල්ලි අනුපාතයද මෙම වර්ෂයේදී ඉහළ මට්ටමක පැවතිණි. එය සියයට 15·0 ක් වී, ඉකුත් වර්ෂයේදී එය සියයට 12·7ක් විය. මහ බැංකුවේ සම්පත් මත වෙළඳ බැංකු රැඳියාවද 1970 වර්ෂයට වඩා සාමාන්‍ය වශයෙන් පහත් මට්ටමක පැවතිණි.

**2. (ආ) ශාඛා ව්‍යාප්තිය**

1963–71 කාලච්ඡේදය තුළදී ලාංකික හා විදේශීය බැංකු ශාඛා ව්‍යාප්තියත් ඒවායේ තැන්පතු ව්‍යාප්තියත් II (ආ) 7 සංඛ්‍යා සටහනින් දක්වා ඇත.

**II (ආ) 7 සංඛ්‍යා සටහන**

**1963 හා 1971 අතර කාලයේදී බැංකු කාර්යාල සහ බැංකු තැන්පතු ව්‍යාප්තවූ ආකාරය**

| වර්ෂය | එකතුව | | | ලාංකික බැංකු | | | බ්‍රිතාන්‍ය බැංකු | | | ඉන්දියානු සහ පකිස්ථානු බැංකු | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | කාර්යාල ගණන | තැන්පතු | | කාර්යාල ගණන | තැන්පතු | | කාර්යාල ගණන | තැන්පතු | | කාර්යාල ගණන | තැන්පතු | |
| | | ශේෂය රු. ද. ලක්ෂ | % | | ශේෂය රු. ද. ලක්ෂ | % | | ශේෂය රු. ද. ලක්ෂ | % | | ශේෂය රු. ද. ලක්ෂ | % |
| 1963 | 83 | 1,301 | 100 | 67 | 801 | 61 | 12 | 412 | 32 | 4 | 88 | 7 |
| 1964 | 88 | 1,447 | 100 | 72 | 943 | 65 | 12 | 415 | 29 | 4 | 90 | 6 |
| 1965 | 97 | 1,546 | 100 | 81 | 1,023 | 66 | 12 | 431 | 28 | 4 | 92 | 6 |
| 1966 | 105 | 1,502 | 100 | 89 | 1,003 | 67 | 12 | 419 | 28 | 4 | 80 | 5 |
| 1967 | 133 | 1,637 | 100 | 117 | 1,157 | 71 | 12 | 404 | 25 | 4 | 76 | 5 |
| 1968 | 141 | 1·808 | 100 | 125 | 1,329 | 73 | 12 | 409 | 23 | 4 | 71 | 4 |
| 1969 | 155 | 1,917 | 100 | 140 | 1,405 | 73 | 11 | 437 | 23 | 4 | 74 | 4 |
| 1970 | 165 | 2,394 | 100 | 152 | 1,831 | 76 | 9 | 472 | 20 | 4 | 91 | 4 |
| 1971 | 189 | 2,516 | 100 | 176* | 1,951 | 77 | 9 | 471 | 19 | 4 | 94 | 4 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

සටහන: 1969 සහ 1970 අතර වර්ෂය තුළදී බ්‍රිතාන්‍ය බැංකු සංඛ්‍යාව අඩුවීමට හේතුවූ කරුණු මෙසේය.

1. 1969 වර්ෂයේදී සීමාසහිත ඊස්ටර්න් බැංකුව ලාංකික බැංකුවක් බවට පත්වීම.
2. 1970 වර්ෂයේදී හැටන් නැෂනල් බැංකුව පිහිටුවීම සඳහා නැෂනල් හා ග්‍රින්ලේස් බැංකුවේ ශාඛා දෙකක් සහ හැටන් බැංකුව ප්‍රතිසංස්ථාපනය කිරීම.

* 1971 දී විවෘත කරන ලද කච්චේරි ශාඛා ඉවත් කර ඇත.

1970 වර්ෂයේදී ශාඛාවන් 10 ක වැඩිවීමක් සමඟ සසඳන විට මෙම වර්ෂය තුළදී වෙළඳ බැංකු මුළු ශාඛා ගණන 24 කින් වැඩි විය. කෙසේ හෝ 1971 වර්ෂය තුළදී වැඩිවූ ප්‍රමාණයෙන් 10 ක් සමූපකාර ප්‍රාදේශීය බැංකු, මහජන බැංකුව වෙත පවරා ගැනීම නිසා ඇතිවිය. ඒ අනුව අවුරුද්ද තුළදී පිහිටුවන ලද නව ශාඛාවන් ප්‍රමාණය 14 කි. මහජන බැංකුව 1971 දී නව ශාඛාවන් 8 ක් විවෘත කරන ලදී 1970 දී විවෘත කළේ 6 කි. මෙම ශාඛාවන් මැදවච්චිය, ගංගොඩවිල, කොටිකාවත්ත, මරදගහමුල, රඹුක්කන, වාලච්චේනි, පිළියන්දල සහ කොළඹ වරාය තුළ පිහිටුවනු ලැබීය. ලංකා බැංකුව 1971 දී නව ශාඛාවන් 3 ක් විවෘත කළේය. ඒවා මොරටුව (ඉඩම), කයිට්ස්,

සහ මාතලේ පිහිටුවිණි. මීට අමතරව ලංකා බැංකුව මගින් කච්චේරි ශාඛාවන් 19 ක්ද විවෘත කරන ලදී කෙසේ වුවද මෙම කාර්‍යාලයන් හුදෙක්ම කච්චේරිවල සරප් කටයුතු පමණක් පවරා ගැනීම නිසා වර්ෂය තුළදී විවෘත කරන ලද ශාඛාවන් ගණනට මේවා ඇතුළත් කොට නැත. හැටන් නැෂනල් බැංකුවද, මස්කෙළිය. පුස්සැල්ලාව හා ගම්පොළ යන ප්‍රදේශයන්හි ශාඛා කාර්‍යාල තුනක් විවෘත කළේය.

මුළු තැන්පතු ප්‍රමාණයෙන් ලාංකික බැංකු සතුවූ කොටස 1970 අවසානයේදී සියයට 76 සිට 1971 අවසානයේදී සියයට 77 දක්වා වැඩි විය. මෙම වැඩිවීම, බ්‍රිතාන්‍ය බැංකුවල කොටස සියයට 20 සිට සියයට 19 දක්වා අඩුවීම තුළින් ඇතිවූ අතර, ඉන්දියානු හා පකිස්ථානු බැංකු ඒවායේ කොටස් අනුපාතිකය සියයට 4 ක්ව තවදුරටත් පවත්වා ගැණිනි. ඉතුරුම් තැන්පතුවල මුළු වැඩිවීමෙන් සියයට 90 කට වඩා වැඩි ප්‍රමාණයක් ලාංකික බැංකු සතුවූ අතර, ඉකුත් වර්ෂයට වෙනස්ව මෙම වර්ෂයේදී කාලීන තැන්පතුවල ඇතිවූ මුළු වැඩිවීමෙන් සියයට 75 ක් පමණ ලාංකික බැංකු සතුවිය. මුළු ඉල්ලුම් තැන්පතුවල ඇතිවූ අඩුවීමෙන් සියයට 85 කට වඩා වැඩි ප්‍රමාණයක් විදේශීය බැංකු තුළ දක්නට ලැබුණි.

සියළුම බැංකු සම්බන්ධයෙන් පෞද්ගලික අංශයේ ඉල්ලුම් තැන්පතු සාමාන්‍ය ප්‍රමාණය 1970 අවසානයේදී රුපිල් 5,470 ක සිට 1971 අවසානයේදී රුපියල් 5,289 දක්වා අඩුවිය ඉතුරුම් තැන්පතු සාමාන්‍ය ප්‍රමාණයද රුපියල් 1,086 සිට රුපියල් 1,019 දක්වා වූ අඩුවිය. අනික් අතට කාලීන තැන්පතු සාමාන්‍ය ප්‍රමාණය රුපියල් 34,837 සිට රුපියල් 37,821 දක්වා වැඩි විය.

2 (ඈ) බැංකු වත්කම සහ වගකීම් ව්‍යුහය

1960–71 කාලච්ඡේදය සඳහා වෙළඳ බැංකුවල සංගෘහිත වත්කම හා වගකීම්හි තෝරාගත් ශීර්ෂයන් පිළිබඳ සංඛ්‍යාවන් II (ඈ) 8 සංඛ්‍යා සටහනින් පෙන්නුම් කෙරෙයි.

1971 දී වෙළඳ බැංකු මුළු වත්කම්/වගකීම් රුපියල් දශ ලක්ෂ 353·1 කින් වැඩිවූ අතර, ඉකුත් වර්ෂයේදී එහි රුපියල් දශලක්ෂ 557·7 ක වාර්තාගත වැඩිවීමක් දක්නට තිබුණි. 1971 වර්ෂයේදී වගකීම් වැඩිවීමෙන් රුපියල් දශලක්ෂ 122·2 ක් තැන්පතු ස්වරූපයෙන් විය. පෞද්ගලික අංශයේ තැන්පතු රුපියල් දශලක්ෂ 144·6 කින් වැඩිවූ අතර, රජයේ තැන්පතු රුපියල් දශලක්ෂ 22·4 කින් අඩු විය. වෙළඳ බැංකුවල ප්‍රාග්ධනය සහ සංචිතයන් රුපියල් දශලක්ෂ 24·6 කින් වැඩිවිය. 1970 වර්ෂය තුළදී එහි වැඩිවීම රුපියල් දශලක්ෂ 17·8 ක් විය. ඉකුත් වර්ෂයේදී වූ රුපියල් දශලක්ෂ 4·3 ක වැඩිවීමකට සාපේක්ෂව මෙම වර්ෂයේදී මහ බැංකුවෙන් ගත් ණය රුපියල් දශලක්ෂ 24·4 කින් වැඩිවිය. 1970 වර්ෂය තුළදී විදේශීය බැංකුවලින් ගත් ණය රුපියල් දශලක්ෂ 7.9 කින් අඩුවුවද මෙවර එහි වූ වැඩිවීම රුපියල් දශලක්ෂ 7·0 ක් විය. වෙළඳ බැංකුවල "අනෙකුත් වගකීම්" තුළ රුපියල් දශලක්ෂ 185·0 ක වාර්තාගත වැඩිවීමක් දක්නට තිබුණි. 1970 දී එහි වැඩිවීම රුපියල් දශලක්ෂ 57·9 කි.

වත්කම් අංශය ගෙන බලනවිට බැංකු ණය හා අත්තිකාරම් රුපියල් දශලක්ෂ 217·8 කින් වැඩිවිය. ඉකුත් වර්ෂයේදී එහි රුපියල් දශලක්ෂ 112·0 ක අඩුවීමක් දැකිය හැක. 1970 වර්ෂය තුළදී බැංකු වෙත වූ ආනයන බිල්පත් රුපියල් දශලක්ෂ 172·8 කින් තියුණු ලෙස අඩුවූ අතර, 1971 දී එය තවදුරටත් රුපියල් දශලක්ෂ 1·2 කින් අඩුවිය. අයිරාවන් සම්බන්ධයෙන් රුපියල් දශලක්ෂ 132·6 ක විශාලතම වැඩිවීමක් වාර්තා විය. මේ අතර, ණය හා අපනයන බිල්පත් පිළිවෙලින් රුපියල් දශලක්ෂ 77·2 කින් සහ රුපියල් දශලක්ෂ 9·0 කින් වැඩිවුණි.

මෙම වර්ෂය තුළදී බැංකු ද්‍රවශීලතා තත්වයෙහි සැළකිය යුතු වැඩි දියුණුවක් දක්නට ලැබුණි. 1971 තුළදී කාසි ප්‍රමාණයෙහි (ව්‍යවස්ථාපිත සංචිතයන් ඇතුලත්ව) වැඩිවීම රුපියල් දශලක්ෂ 7·1 ක් පමණක් වුවද මුළු තැන්පතු සඳහා වූ කාසි දැරීම්හි මාසික

## II (ඇ) 8 සංඛ්‍යා සටහන
## වෙළඳ බැංකුවල වත්කම් හා වගකීම්හි තෝරාගත් ශීර්ෂයන්
### (මාසික සංඛ්‍යාවල සාමාන්‍ය අනුවය.)

රුපියල් දශලක්ෂ

| | 1960 | 1961 | 1962 | 1963 | 1964 | 1965 | 1966 | 1967 | 1968 | 1969 | 1970* | 1971 | කාලච්ඡේදය අවසානයේදී | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | දෙසැම් 1970 | දෙසැම් 1971 |
| අතැති මුදල් සහ මහ බැංකුව වෙතැති තැන්පතු (ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා ඇතුළුව) .. .. | 132 | 148 | 186 | 164 | 182 | 224 | 233 | 218 | 247 | 250 | 248 | 369 | 371 | 378 |
| විදේශීය ශේෂ .. .. .. | 58 | 54 | 55 | 44 | 49 | 55 | 62 | 57 | 72 | 63 | 36 | 51 | 44 | 70 |
| භාණ්ඩාගාර බිල්පත් .. .. .. | 28 | 51 | 89 | 128 | 73 | 89 | 124 | 80 | 102 | 50 | 41 | 308 | 281 | 321 |
| වට්ටම් කළ බිල්පත් .. .. .. | 115 | 122 | 136 | 114 | 126 | 173 | 175 | 198 | 252 | 241 | 275 | 158 | 144 | 152 |
| මුළු ද්‍රවශීල වත්කම් .. .. .. | 333 | 375 | 466 | 450 | 430 | 541 | 594 | 553 | 673 | 604 | 600 | 886 | 841 | 921 |
| මුළු ආයෝජන** .. .. .. | 284 | 290 | 303 | 313 | 330 | 329 | 330 | 300 | 278 | 275 | 263 | 373 | 362 | 373 |
| මුළු ණය හා අයිරාවන් .. .. .. | 430 | 435 | 477 | 495 | 633 | 669 | 682 | 809 | 1000 | 1240 | 1391 | 1490 | 1403 | 1613 |
| ඉල්ලුම් තැන්පතු† .. .. .. | 657 | 677 | 829 | 789 | 853 | 917 | 949 | 914 | 955 | 945 | 958 | 1219 | 1225 | 1199 |
| කාලීන හා ඉතුරුම් තැන්පතු .. .. .. | 340 | 359 | 380 | 460 | 535 | 572 | 631 | 649 | 798 | 915 | 989 | 1238 | 1169 | 1317 |
| මුළු තැන්පතු .. .. .. | 998 | 1036 | 1209 | 1250 | 1389 | 1490 | 1580 | 1564 | 1755 | 1863 | 1948 | 2458 | 2394 | 2516 |
| අනුපාතය .. .. .. | % | % | % | % | % | % | % | % | % | % | % | % | % | % |
| ඉල්ලුම් තැන්පතු සඳහා වූ මුදල් .. .. .. | 20·1 | 21·9 | 22·4 | 20·8 | 21·3 | 24·4 | 24·5 | 23·8 | 25·9 | 26·4 | 25·9 | 30·3 | 30·3 | 31·5 |
| මුළු තැන්පතු සඳහා වූ මුදල් .. .. .. | 13·2 | 14·3 | 15·4 | 13·1 | 13·1 | 15·0 | 14·7 | 13·9 | 14·1 | 13·4 | 12·7 | 15·0 | 15·5 | 15·0 |
| මුළු තැන්පතු සඳහා වූ විදේශීය ශේෂ .. .. .. | 5·8 | 5·2 | 4·5 | 3·5 | 3·5 | 3·7 | 3·9 | 3·6 | 4·1 | 3·4 | 1·8 | 2·1 | 1·8 | 2·8 |
| මුළු තැන්පතු සඳහා වූ භාණ්ඩාගාර බිල්පත් .. .. | 2·8 | 4·9 | 7·4 | 10·2 | 5·3 | 6·0 | 7·8 | 5·1 | 5·8 | 2·7 | 2·1 | 12·5 | 11·7 | 12·8 |
| මුළු තැන්පතු සඳහා වූ වට්ටම් කළ වාණිජ බිල්පත් .. | 11·5 | 11·8 | 11·2 | 9·1 | 9·1 | 11·6 | 11·1 | 12·7 | 14·4 | 12·9 | 14·1 | 6·4 | 6·0 | 6·0 |
| ඉල්ලුම් තැන්පතු සඳහා වූ ද්‍රවශීල වත්කම් .. .. | 50·7 | 55·4 | 56·2 | 57·0 | 50·4 | 59·0 | 62·6 | 60·5 | 70·5 | 63·9 | 62·6 | 72·7 | 68·6 | 76·8 |
| මුළු තැන්පතු සඳහා වූ ද්‍රවශීල වත්කම් .. .. | 33·4 | 36·2 | 38·5 | 36·0 | 31·0 | 36·3 | 37·6 | 35·4 | 38·3 | 32·4 | 30·8 | 36·0 | 35·1 | 36·6 |
| මුළු තැන්පතු සඳහා වූ ආයෝජන .. .. | 28·5 | 28·0 | 25·1 | 25·0 | 23·8 | 22·1 | 20·9 | 19·2 | 15·8 | 14·8 | 13·5 | 15·2 | 15·1 | 14·8 |
| මුළු තැන්පතු සඳහා වූ ණය හා අයිරාවන් .. .. | 43·1 | 42·0 | 39·4 | 39·6 | 45·6 | 44·9 | 43·2 | 51·7 | 57·0 | 66·6 | 71·4 | 60·6 | 58·6 | 64·1 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

* 1970 වර්ෂයේ අවසාන මාස තුන තුළදී වෙළඳ බැංකු වත්කම් හා වගකීම්හි විකෘති ස්වභාවයක් දැකිය හැක්කේ රුපියල් 100 සහ 50 නෝට්ටු විමුල්‍යනයෙහි ප්‍රතිඵලයක් වශයෙනි. ජනවාරි මාසයේ සිට සැප්තැම්බර් මාසය දක්වා වූ සංඛ්‍යාවන්ට අනුව මෙම තීරුවල සංඛ්‍යාවන් ගණනය කර ඇත.

** රජයේ හා රජය මගින් සහතික කළ සුරැකුම් පත්, පෞද්ගලික සුරැකුම්පත් සහ මහ බැංකුවේ නිකුතු

† දේශීය අන්තර් බැංකු තැන්පතු ඇතුළත් නැත

සාමාන්‍ය අනුපාතිකය 1970 දී සියයට 12·7 ක සිට 1971 දී සියයට 15·0 දක්වා වැඩිවිය. අනෙකුත් ද්‍රවශීල වත්කම් අතරින්, භාණ්ඩාගාර බිල්පත් දැරීම්හි මාසික සාමාන්‍යය 1970 වර්ෂයේදී මුළු තැන්පතු සඳහා සියයට 2·1 ක සිට 1971 දී සියයට 12·5 දක්වා වැඩිවිය. මේ අතර, මුළු තැන්පතු සඳහා වූ වාණිජ බිල්පත් මාසික සාමාන්‍යය සියයට 14·1 සිට සියයට 6·4 දක්වා අඩුවිය. මුළු තැන්පතු සඳහා වූ විදේශීය ශේෂයන් සියයට 1·8 සිට සියයට 2·1 දක්වා වැඩිවිය. මේ අනුව මුළු තැන්පතු සඳහා වූ ද්‍රවශීල වත්කම්හි මාසික සාමාන්‍ය අනුපාතිකය, 1970 වර්ෂයේදී සියයට 30·8 සිට 1971 වර්ෂයේදී සියයට 36·0 දක්වා වැඩිවිය.

මෙම අවුරුද්ද තුළදී බැංකු ණය සඳහා පැවති අඩු ඉල්ලුම, ණය සහ අයිරාවන්ගේ මාසික මට්ටම් තුළින්ද පිළිබිඹු වෙයි. 1970 දී ඉල්ලුම් තැන්පතු සඳහා වූ ණය සහ අයිරා සාමාන්‍යය සියයට 71·4 සිට සියයට 60·6 දක්වා අඩුවිය. ද්‍රවශීලතාවයෙහි දියුණුවක් තිබියදීත් ඉල්ලුමෙහි වූ මඳ බව, බැංකු ආයෝජන වැඩිවීමකට මග පෑදිය මුළු තැන්පතු සඳහා වූ ආයෝජනයන්ගේ අනුපාතය, 1970 දී සියයට 13·5 ක මාසික සාමාන්‍යයේ සිට විමර්ශණයට භාජනය වූ කාලච්ඡේදය තුළදී සියයට 15·2 දක්වා වැඩි විය.

2. (ඈ) අරමුදල් මූලාශ්‍ර සහ ඒවායේ උපයෝගීකරණය

1968-71 කාලපරිච්ඡේදය තුළදී වාණිජ බැංකුවල සම්පත් හා ඒවා උපයෝගීකරණය පිළිබඳ වාර්ෂික වෙනස්කම් II (ඈ) 9 සටහනෙහි ඇතුළත් වේ.

1970 දී වෙළඳ බැංකු සමග වූ පෞද්ගලික අංශයේ (රාජ්‍ය සංස්ථා සහ සමුපකාරයන්ද ඇතුළුව) ගනුදෙනු, රාජ්‍ය අංශයේ ප්‍රයෝජනය සඳහා සැළකියයුතු සම්පත් ප්‍රමාණයක් මුදාහරින ලදී. එහෙත් විමර්ශණයට භාජනය කෙරෙන වර්ෂය තුළදී පෞද්ගලික අංශය, වෙළඳ බැංකු සමඟ වූ ගනුදෙනු වලදී ස්වයං-මූලාප පහසුකම්හිම රැඳුනි. 1971 වර්ෂයේදී වෙළඳ බැංකු සම්පත්හි වූ වැඩිවීමෙන් රුපියල් දශලක්ෂ 75·1 ක් රාජ්‍ය අංශය මගින් ප්‍රයෝජනයට ගැනුනි. මෙය, වෙළඳ බැංකු සමඟ වූ රජයේ තැන්පත්හි රුපියල් දශලක්ෂ 22·3 ක අඩුවීමකින්ද බැංකුවල රාජ්‍ය පත්‍ර සහ රජයේ ආනයන බිල්පත් පිළිවෙලින් රුපියල් දශලක්ෂ 50·4 කින් සහ රුපියල් දශලක්ෂ 2·4 කින් වැඩිවීමෙන්ද සමන්විත විය. ඉකුත් වර්ෂයේදී රාජ්‍ය අංශය මගින් වෙළඳ බැංකු සම්පත් උපයෝගීකර ගැනීමේ වැඩිවීම රුපියල් දශලක්ෂ 335·6 ක් වූ අතර, එය මුළුමනින්ම වාගේ බැංකුවල රාජ්‍ය පත්‍ර දැරීම්හි වූ වැඩිවීමක් ස්වරූපයෙන් සිදුවිය. 1970 දි රුපියල් දශලක්ෂ 215·5 ක් වූ එකතුවීමක් සමඟ සසඳන කල්හි 1971 වර්ෂයේදී රාජ්‍ය අංශය මගින් වෙළඳ බැංකු සම්පත්වලට කළ එකතු කිරීම රුපියල් දශලක්ෂ 3·5 ක් වූ සැලකියයුතු නොවන තරම් ප්‍රමාණයක් විය. ඒ අනුව ඉකුත් වර්ෂයෙහි වූ රුපියල් දශලක්ෂ 120·1 සමඟ සසඳන කල්හි වෙළඳ බැංකු වෙතින් රාජ්‍ය අංශයට වූ ශුද්ධ ගලායාම රුපියල් දශලක්ෂ 71·6 ක් විය.

පෞද්ගලික අංශයේදී, සමුපකාර ආයතනයන් මගින් ඒවායේ තැන්පතු වැඩිකිරීමෙන් සහ අත්තිකාරම් අඩුකිරීමෙන් වෙළඳ බැංකු සම්පත් වැඩිකරලීමට රුපියල් දශලක්ෂ 21·8 කින් දායක විය. ඉකුත් වර්ෂයේදී සමුපකාර ආයතන විසින් බැංකු සම්පත් ප්‍රයෝජනයට ගැනීම රුපියල් දශලක්ෂ 146·3 කින් වැඩිකරන ලද අතර, වාණිජ බැංකු සම්පත් වැඩි කිරීම කෙරේ දායක වී තිබුණේ රුපියල් දශලක්ෂ 19·0 කින් පමණි. 1971 වර්ෂය තුළදී රාජ්‍ය සංස්ථාවන් වෙත බැංකු සම්පත් ගලායෑමෙහි වූ ශුද්ධ වැඩිවීම රුපියල් දශලක්ෂ 34·5ක් විය. එය සමන්විත වූයේ, රාජ්‍ය සංස්ථාවනට දෙන ලද බැංකු අත්තිකාරම් රුපියල් දශලක්ෂ 62·3 කින් වැඩිවීමෙන් හා බැංකු වෙත වූ සංස්ථාවන් සතු තැන්පතු රුපියල් දශලක්ෂ 27·8 කින් වැඩි වීමෙනි. 1970 වර්ෂයේදී රාජ්‍ය සංස්ථාවන් විසින් අත්තිකාරම් මාර්ගයෙන් බැංකු සම්පත් උපයෝගී කර ගැනීම රුපියල් දශලක්ෂ 43·1 ක ප්‍රමාණයක් දක්වා වැඩි කරන ලදී. එහෙත් එමගින් රුපියල් දශලක්ෂ 44·7 ක තැන්පතු වැඩිවීමක් මාර්ගයෙන් බැංකු සඳහා සම්පත් ප්‍රමාණයක් සපයන ලදී. පෞද්ගලික අංශයේ අනෙකුත් කොටස් ගැන සලකන විට, 1971 වර්ෂය තුළදී අත්තිකාරම් ස්වරූපයෙන් රුපියල්

## II (ඈ) 9 සංඛ්‍යා සටහන

## 1968 - 1971 කාලය තුලදී බැංකු සම්පත් වල වාර්ෂික වෙනස්වීම් සහ ඒවා ප්‍රයෝජනයට ගත් ආකාරය.

රුපියල් දශලක්ෂ

| | 1968 | 1969 | 1970 | 1971 |
|---|---|---|---|---|
| **අරමුදල් ලබාගත් මාර්ගයන්** | | | | |
| 1· රාජ්‍ය අංශය .. .. | 150·9 | 83·0 | 215·5 | 3·5 |
| රාජ්‍ය පත්‍රිකා දැරීමහි අඩුවීම .. | — | 83·0 | — | — |
| තැන්පතු වැඩිවීම .. .. .. | 25·9 | — | 73·7 | — |
| ආනයන බිල්පත් අඩුවීම .. .. | 125·0 | — | 141·8 | — |
| කෙටිකාලීන ණය අඩුවීම (අ) .. .. | — | — | — | 3·5 |
| 2· මහ බැංකුව .. .. | 2·3 | 89·3 | 4·3 | 39·8 |
| ණය ගැනීම වැඩිවීම .. .. | — | 84·3 | 4·3 | 24·5 |
| සංචිත අඩුවීම .. .. | 2·3 | 5·0 | — | 15·3 |
| 3· රජයේ සමායතන .. .. | — | — | 44·7 | 27·8 |
| තැන්පතු වැඩිවීම .. .. | — | — | 44·7 | 27·8 |
| අත්තිකාරම් අඩුවීම .. .. | — | — | — | — |
| 4· සමුපකාර ආයතන .. .. | 0·6 | — | 19·0 | 21·8 |
| තැන්පතු වැඩිවීම .. .. | 0·6 | — | 19·0 | 18·4 |
| අත්තිකාරම් අඩුවීම ,. .. | — | — | — | 3·4 |
| 5· අනිකුත් දේශීය පෞද්ගලික අංශය .. | 167·1 | 132·9 | 363·4 | 98·8 |
| තැන්පතු වැඩිවීම .. .. | 167·1 | 132·9 | 341·9 | 98·8 |
| අත්තිකාරම් සහ ආයෝජන අඩුවීම .. | — | — | 21·5 | — |
| 6· අන්තර්-බැංකු (ආ) .. .. | 62·5 | 35·8 | 77·6 | 209·6 |
| ප්‍රාග්ධනය හා සංචිත වැඩිවීම .. .. | 6·1 | 14·5 | 17·8 | 24·6 |
| ස්ථාවර හා අනිකුත් වත්කම් අඩුවීම .. | — | 0·1 | — | — |
| ''අනිකුත්'' වගකීම් වැඩිවීම .. .. | 52·4 | 21·2 | 57·9 | 185·0 |
| අන්තර්-බැංකු ගනුදෙනු (ශුද්ධ) .. .. | 4·0 | — | 1·9 | — |
| කැට මුදල් අඩුවීම .. .. | — | — | — | — |
| 7· විදේශීය අංශය .. .. .. | 7·3 | 27·6 | 9·1 | 7·0 |
| ණය ගැනීම වැඩිවීම .. .. | 7·1 | 3·0 | — | 7·0 |
| තැන්පතු වැඩිවීම .. .. | 0·2 | — | 0.7 | — |
| විදේශීය ශේෂ අඩුවීම .. .. | — | 24·6 | 8·4 | — |
| සම්පත්වල මුළු වැඩිවීම .. .. | 390·7 | 368·6 | 733·6 | 408·3 |
| **අරමුදල් ප්‍රයෝජනයට ගත් ආකාරය** | | | | |
| 1· රාජ්‍ය අංශය .. .. .. | 10·1 | 100·4 | 335·6 | 75·1 |
| රාජ්‍ය පත්‍රිකා දැරීමහි වැඩිවීම .. .. | 10·1 | — | 335·0 | 50·4 |
| තැන්පතු අඩුවීම .. .. .. | — | 4·3 | — | 22.3 |
| රජයේ ආනයන බිල්පත් වැඩිවීම .. .. | — | 87·9 | — | 2·4 |
| කෙටිකාලීන ණය වැඩිවීම (අ) .. .. | — | 8·2 | 0·6 | — |
| 2· මහ බැංකුව .. .. .. | 14·8 | — | 88·3 | — |
| ණය ගැනීම අඩුවීම .. .. | 14·8 | — | — | — |
| සංචිත වැඩිවීම .. .. .. | — | — | 88·3 | — |
| 3· රජයේ සමායතන .. .. | 115·5 | 85·4 | 43·1 | 62·3 |
| තැන්පතු අඩුවීම .. .. | 24·9 | 15·5 | — | — |
| අත්තිකාරම් වැඩිවීම .. .. | 90·6 | 69·9 | 43·1 | 62·3 |
| 4· සමුපකාර ආයතන .. .. | 18·5 | 23·8 | 146·3 | — |
| තැන්පතු අඩුවීම .. .. | — | 3·9 | — | — |
| අත්තිකාරම් වැඩිවීම .. .. | 18·5 | 19·9 | 146·3 | — |
| 5· අනිකුත් දේශීය පෞද්ගලික අංශය .. | 181·8 | 142·1 | — | 84·1 |
| තැන්පතු අඩුවීම .. .. | — | — | — | — |
| අත්තිකාරම් සහ ආයෝජන වැඩිවීම .. | 181·8 | 142·1 | — | 84·1 |
| 6· අන්තර් බැංකු (ආ) .. .. | 39·4 | 15·7 | 112·3 | 151·4 |
| ප්‍රාග්ධනය හා සංචිත අඩුවීම .. .. | — | — | — | — |
| ස්ථාවර හා අනිකුත් වත්කම් වැඩිවීම .. | 17·6 | — | 88·1 | 128·2 |
| ''අනිකුත්'' වගකීම් අඩුවීම .. .. | — | — | — | — |
| අන්තර්-බැංකු ගනුදෙනු (ශුද්ධ) .. .. | — | 0·8 | — | 0·8 |
| කැට මුදල් වැඩිවීම .. .. | 21·8 | 14·9 | 24·2 | 22·4 |
| 7· විදේශ අංශය .. .. .. | 10·6 | 1·0 | 7·9 | 35·1 |
| ණය ගැනීම අඩුවීම .. .. | — | — | 7·9 | — |
| තැන්පතු අඩුවීම .. .. .. | — | 1·0 | — | 0·4 |
| විදේශීය ශේෂ වැඩිවීම .. .. | 10·6 | — | — | 34·7 |
| ප්‍රයෝජනයට ගත් සම්පත්වල මුළු වැඩිවීම .. | 390·7 | 368·4 | 733·5 | 408·0 |

මූලය. ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) මෙම ශීර්ෂය, රජයේ ගිණුම මත මිළදී ගත් චෙක්පත්, මුදල් ඇනවුම් හා සම්බන්ධිතය.

(ආ) වෙළඳ බැංකු ක්‍රමය තුළ සිදුවන ගනුදෙනු හේතු කොට ගෙන වත්කම්/වගකීම්හි ඇතිවන වෙනස්වීම් සියල්ලක්ම මෙහි ඇතුළත්ය. පෞද්ගලික අංශය සමග ඇති, බැංකුවල ''අනිකුත්'' වගකීම්හි වෙනස්වීම් හේතුකොට ගෙන සිදුවන ගනුදෙනු සමහරක් මෙහි සළහන් කරන්නේ, සමායතන, සමුපකාර ආයතන සහ පෞද්ගලික අංශයේ අනිකුත් කොටස් වලට මෙම ශීර්ෂයෙහි වෙනස්වීම් ඇතුළත් කිරීමට ඇති දුෂ්කරතාව නිසාය.

දශලක්ෂ 84·1 ක බැංකු සම්පත් උපයෝගී කරගන්නා ලද අතර, තැන්පතු වැඩිකිරීමක් ස්වරූපයෙන් බැංකු සම්පත්හි වූ වැඩිවීමට රුපියල් දශලක්ෂ 98·8 කින් දායක විය. පෞද්ගලික අංශයේ අනෙකුත් කොටස් වලින් බැංකු වෙතවූ සම්පත්හි ශුද්ධ වැඩිවීම රුපියල් දශලක්ෂ 14·7 ක ප්‍රමාණයක් හැටියට සටහන් විය. ඉකුත් වර්ෂයේදී වූ වැඩිවීම රුපියල් දශලක්ෂ 363·4 ක් වූයේ, එය තැන්පතුවල රුපියල් දශලක්ෂ 341·9 ක වැඩිවීමකින් හා අත්තිකාරම් සහ ආයෝජනයන්හි රුපියල් දශලක්ෂ 21·5 ක අඩුවීමකින් සමන්විත විය.

පෞද්ගලික අංශය සමස්ථයක් වශයෙන් ගත්විට 1971 වර්ෂය තුළදී එම අංශය මගින් බැංකු සම්පත් උපයෝගීකරණයෙහි වැඩිවීම රුපියල් දශලක්ෂ 146·4 ක් විය. මේ අතර, එම අංශය මගින් බැංකු සඳහා වූ සම්පත් රුපියල් දශලක්ෂ 148·4 ක ප්‍රමාණයකින් වැඩිකරන ලදී. ඉකුත් වර්ෂයේදී බැංකු සම්පත් උපයෝගීකරණය රුපියල් දශලක්ෂ 189·4 ක ප්‍රමාණයක් වූ අතර, මෙම අංශය වෙතින් බැංකු සම්පත් වෙත එක් කරන ලද ප්‍රමාණය රුපියල් දශලක්ෂ 427·1 ක් විය. ඒ අනුව, එම අංශය වෙතින් බැංකු සඳහා රුපියල් දශලක්ෂ 237·7 ක ශුද්ධ ගලායෑමක් පෙන්නුම් කෙරිණි.

විදේශීය අංශය මගින් වෙළඳ බැංකුවලට රුපියල් දශලක්ෂ 1·2 ක ශුද්ධ එකතුවක් ඇතිකළ ඉකුත් වර්ෂය හා සැසඳීමේදී 1971 වර්ෂය තුළ බැංකු ක්‍රමය තුළින් විදේශීය අංශය වෙතට රුපියල් දශලක්ෂ 28·1 ක ශුද්ධ ගලයාමක් දක්නට තිබුණි. එය සමන්විත වූයේ, විදේශීය ශේෂයන්හි රුපියල් දශලක්ෂ 34·7 ක වැඩිවීමක් හා විදේශීය ණය ගැනීම්හි රුපියල් දශලක්ෂ 7·0 ක වැඩිවීමක් මගිනි. 1971 වර්ෂයේදී දේශීය වෙළඳ බැංකු ක්‍රමය තුළින්ම සම්පත්වලට වූ එකතුවීම රුපියල් දශලක්ෂ 209·6 ක ප්‍රමාණයක් වූ අතර, වෙළඳ බැංකු ක්‍රමය තුළ වූ සම්පත් උපයෝගීකරණය රුපියල් දශලක්ෂ 151·4 කි. ඉකුත් වර්ෂයේදී බැංකු ක්‍රමය තුළ වූ සම්පත් උපයෝගීකරණය රුපියල් දශලක්ෂ 34.7 කින් සම්පත් එකතුවීම ඉක්මවීය.

1971 වර්ෂයේදී වෙළඳ බැංකු සම්පත්හි වැඩිවීම කෙරේ මහ බැංකුව රුපියල් දශලක්ෂ 39·8 කින් දායක විය. එහෙත් ඉකුත් වර්ෂයේදී වෙළඳ බැංකු වෙතින් මහ බැංකුවට රුපියල් දශලක්ෂ 84·0 ක ශුද්ධ සම්පත් ගලායෑමක් විය. 1971 වර්ෂයේදී කෘෂිකාර්මික ණය ක්‍රමය යටතේ මහ බැංකුව මගින් දෙන ලද ප්‍රතිමූල්‍ය ණය පහසුකම් රුපියල් දශලක්ෂ 9 0 කින් වැඩිවිය. මේ අතර, සහතික මිල ක්‍රමය සම්බන්ධයෙන් වූ ප්‍රතිමූල්‍ය ණය පහසුකම් රුපියල් දශලක්ෂ 4·1 කින් අඩුවිය. මැදි හා දිගුකාලීන ණය අරමුදල යටතේ සැපයූ ප්‍රතිමූල්‍ය පහසුකම් රුපියල් දශලක්ෂ 4·8 කින්ද අනිකුත් අත්තිකාරම් රුපියල් දශලක්ෂ 11·9 කින්ද වැඩි විය. මීට අමතරව, මුළු ඉල්ලුම් තැන්පතුවල වූ අඩුවීම හේතු කොටගෙන මහ බැංකුව වෙත වූ වෙළඳ බැංකු සංචිතයන් රුපියල් දශලක්ෂ 15·3 කින් අඩුකර ගැනීමට වෙළඳ බැංකු සමත්විය.

2. (ඊ) පෞද්ගලික අංශයට දෙන ලද බැංකු ණය

මෙම වර්ෂය තුළදී පෞද්ගලික අංශයට දෙන ලද බැංකු ණය වැඩිවීම රුපියල් දශලක්ෂ 152 4 ක් විය. ඒවායින් රුපියල් දශලක්ෂ 62·3 ක ප්‍රමාණයක් සංස්ථාවන්ටද රුපියල් දශලක්ෂ 90·1 ක ප්‍රමාණයක් පෞද්ගලික අංශයේ අනෙකුත් කොටස් සඳහාද දෙනු ලැබීය. 1971 වර්ෂයේදී බැංකු ණය සඳහා වූ ඉල්ලුම අවුරුද්දේ මාස කිහිපයක් තුළදී පමණක් ඇති වූවකි. ඇත්තවශයෙන්ම රුපියල් දශලක්ෂ 152·4 ක් වූ මුළු වැඩිවීමෙන් භාගයකටත් වඩා ඉල්ලුමක් ඇතිවූයේ අවසාන මාසය තුළදීය. අප්‍රේල් මාසයේදී සංස්ථාවන්ට වූ ණය දීම්හි සැහෙන වැඩිවීමක් පෙන්නුම් කළ අතර, ඊට සාපේක්ෂව සුළු වැඩිවීම් ජූලි සහ දෙසැම්බර් යන මාසයන්හිදී දක්නට ලැබුණි. සංස්ථාවන් වෙතින් ණය සඳහා වූ ඉල්ලුමේ සාමාන්‍ය අඩුවීමක් අවුරුද්දෙහි ඉතිරි කාලය තුළදී පිළිබිඹු විය. වර්ෂය තුළදී රාජ්‍ය සංස්ථාවන්ට වූ ණය වැඩිවීම් වලින් තුනෙන් පංගුවකටත් වඩා ඇතිවූයේ අවුරුද්දේ අවසාන මාසය තුළදීය. මාර්තු සිට මැයි මාසය දක්වාත්, යළිත්

ඔක්තෝබර් මාසයේදීත් සමුපකාරයන්ට දෙන ලද බැංකු ණය සෑහෙන ප්‍රමාණයකින් වැඩිවිණ. කෙසේවුවද, මෙම වර්ෂය සමස්ථයක් වශයෙන් ගත් විට සමුපකාරයන්ට දෙන ලද ණය රුපියල් දශලක්ෂ 3 4 කින් අඩුවී ඇති බව පෙනේ. පෞද්ගලික අංශයේ අනිකුත් කොටස් සඳහා දෙන ලද ණය වැඩිවීම්වලින් සියයට 50 කටත් වඩා දෙනු ලැබූයේ දෙසැම්බර් මාසය තුළදීය. මේ අතර ජනවාරි, අප්‍රේල් සහ සැප්තැම්බර් යන මාස වලදීද සෑහෙන වැඩිවීම් වාර්තාවිය.

මෙම අවුරුද්ද තුළදී, බැංකු ණය දීමනාවන්හි ඇතිවූ වැඩිවීම, ප්‍රධාන වශයෙන්ම ණය සහ අයිරා ස්වරූපයෙන් විය. එහෙත් ඉකුත් වසරේදී එහි වූ වැඩිවීම ප්‍රධාන වශයෙන්ම එකතුවෙමින් පවත්නා මුදල් ශීර්ෂයන්ගෙන් යුක්ත වූ බව පැහැදිලිය. 1971 දී අයිරාවන්හි රුපියල් දශලක්ෂ 133·0 ක විශාල වැඩිවීමක් දක්නට තිබුණි. ඒවායින් රුපියල් දශලක්ෂ 68·9 ක් සංස්ථාවන්ට දෙනු ලැබූ අතර, පෞද්ගලික අංශයේ අනිකුත් කොටස් වලට දෙන ලද ප්‍රමාණය රුපියල් දශලක්ෂ 64·1 කි. 1971 අවුරුද්ද තුළදී නොපියවා ඇති ණය මුදල් ප්‍රමාණයේ වැඩිවීම රුපියල් දශලක්ෂ 77·2 ක් වූ අතර, එයින් කෘෂිකාර්මික ණය ක්‍රමය යටතේ ණය මුදල් ප්‍රමාණයෙහි වූ වැඩිවීම රුපියල් දශලක්ෂ 22·6 ක් විය. ඉතිරියෙන්, රාජ්‍ය සංස්ථාවන්ට දෙන ලද ණය මුදල් රුපියල් දශලක්ෂ 14·0 කින් අඩුවූ අතර, පෞද්ගලික අංශයේ අනිකුත් කොටස්වලට දෙන ලද ඒවා රුපියල් දශලක්ෂ 68·6 කින් වැඩිවිණි.

### II (ඈ) 10 සංඛ්‍යා සටහන
### පෞද්ගලික අංශයට දෙන ලද වෙළඳ බැංකු අත්තිකාරම්[1]

රුපියල් දශලක්ෂ

| | ලාංකික බැංකු | | | විදේශීය බැංකු | | | සියළුම බැංකු | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 1970 දෙසැම්බර් | 1971 දෙසැම්බර් | වෙනස | 1970 දෙසැම්බර් | 1971 දෙසැම්බර් | වෙනස | 1970 දෙසැම්බර් | 1971 දෙසැම්බර් | වෙනස |
| (අ) එකතු කෙරිගෙන යන මුදල් ශීර්ෂ 2 .. | 171·3 | 106·8 | — 64·5 | 0·2 | 1·4 | + 1·2 | 171·4 | 108·2 | — 63·2 |
| (ආ) දේශීය බිල්පත් .. | — | — | — | — | — | — | — | — | — |
| (ඇ) ආනයන බිල්පත් .. | 16·1 | 25·0 | + 8·9 | 20·8 | 8·3 | – 12·5 | 36·9 | 33·3 | — 3·6 |
| (ඈ) අපනයන බිල්පත් .. | 32·1 | 37·3 | + 5·2 | 74·4 | 78·3 | + 3·9 | 106·5 | 115·5 | + 9·0 |
| (ඉ) අයිරාවන් .. | 342·9 | 431·9 | + 89·0 | 245·8 | 289·8 | + 44·0 | 588·7 | 721·7 | +133·0 |
| (ඊ) ණය .. | 731·4 | 818·7 | + 87·3 | 82·8 | 72·7 | — 10·1 | 814·2 | 891·4 | + 77·2 |
| එකතුව | 1293·8 | 1419·8 | +126·0 | 423·9 | 450 4 | + 26·5 | 1717·7 | 1870·1 | +152·4 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

1· රජයේ සමායතනයන්ද ඇතුළත්ය.

2· ණය ලබා ගැනීම සඳහා යැවුනු චෙක්පත්, මුදල් ඇනවුම් ආදියත්, සහතික මිල ක්‍රමය යටතේ ආහාර ද්‍රව්‍යයන් මිළට ගැනීම සඳහා බැංකු මගින් සමුපකාර ආයතනයන්ට දෙනු ලැබූ කෙටිකාලීන අත්තිකාරම්ද මෙම ගණයෙහි අඩංගුවී ඇත.

1971 වර්ෂය තුළදී පෞද්ගලික අංශය සතුව බැංකු වෙතවූ ආනයන බිල්පත් රුපියල් දශලක්ෂ 3 6 කින් අඩුවූ අතර, ඒවායේ අපනයන බිල්පත් දැරීම රුපියල් දශලක්ෂ 9 0 කින් වැඩිවුණි. සහතික මිළ ක්‍රමය යටතේ රජයට වී විකිණීම හා සම්බන්ධ වූ බඩු තොග කුවිතාන්සි අත්තිකාරම් රුපියල් දශලක්ෂ 68·2 කින් අඩුවීම හේතුකොටගෙන එකතුවෙමින් පවත්නා මුදල් ශීර්ෂයන් රුපියල් දශලක්ෂ 63·2 කින් සැලකියයුතු ලෙස අඩුවිය. අනිකුත් මුදල් ශීර්ෂයන් රුපියල් දශලක්ෂ 5·0 කින් වැඩිවිය.

වෙළඳ බැංකු මගින් දෙන ලද අත්තිකාරම්, අරමුණු හා කල්පිරීම් අනුව වර්ගකොට 11 (ඇ) 11 සංඛ්‍යා සටහනින් පෙන්නුම් කෙරේ. මෙම සටහනෙහි දී ඇති සංඛ්‍යාවන් සකස් කරන ලද්දේ, වෙළඳ බැංකු තැන්පතු හා අත්තිකාරම් පිළිබඳ මහ බැංකු සමීක්ෂණයෙනි. මෙම සමීක්ෂණය ත්‍රෛමාසික පදනමක් මත කරනු ලබන අතර, එහි විෂය ක්ෂේත්‍රය තුළට ණය සහ අයිරා ස්වරූපයෙන් රාජ්‍ය සංස්ථාවන්ද ඇතුළුව පෞද්ගලික අංශයට දෙනු ලබන අත්තිකාරම්, අපනයන බිල්පත් සහ ආනයන බිල්පත්ද ඇතුළත් වෙයි. එසේවුවද එකතුවෙමින් පවත්නා මුදල් ශීර්ෂයන් මීට ඇතුළත් නොවේ. 1971 වර්ෂය තුළදී, බැංකු අත්තිකාරම් ව්‍යුහයේ වූ වෙනස්වීම් තුළ දක්නට තිබූ කැපී පෙනෙන ලක්ෂණයක් වූයේ, මුළු අත්තිකාරම් ප්‍රමාණයෙහි කාර්මික හා කෘෂිකාර්මික අරමුණු සඳහා වූ, අත්තිකාරම් අනුපාතය අඩුවීමයි. 1970 දක්වා වූ කාලය තුළදී කාර්මික අරමුණු සඳහා වූ අත්තිකාරම්හි සීඝ්‍ර වැඩිවීමක් දිස්වුනි. 1968 සහ 1969 යන වර්ෂවල වැඩිවීම් පිළිවෙලින් රුපියල් දශලක්ෂ 112·6 ක් සහ රුපියල් දශලක්ෂ 155·6 ක් විය. 1967 අවසානයේදී මෙම අත්තිකාරම්, මුළු අත්තිකාරම් වලින් සියයට 12 2 ක් පමණ වූ නමුත් 1969 අවසානය වනවිට එය සියයට 25·6 දක්වා තියුණු ලෙස වැඩි විය. 1970 දී මෙම අත්තිකාරම්හි වැඩිවීමේ අනුපාතය සැලකියයුතු ලෙස අඩු විය. එම වර්ෂයේ දී අත්තිකාරම් වැඩිවීම රුපියල් දශලක්ෂ 28·7 ක් වූ අතර, මුළු අත්තිකාරම් ප්‍රමාණයෙන් එහි කොටස සියයට 26 9 ක් විය. නිරපේක්ෂ වශයෙන් බලනවිට 1971 දී රුපියල් දශලක්ෂ 37·1 ක සැහෙන වැඩිවීමක් දක්නට ලැබුනද, මුළු ණය ප්‍රමාණයෙහි වූ කාර්මික අත්තිකාරම් කොටස සියයට 25·7 දක්වා අඩුවිය.

1971 දී කාර්මික අරමුණු සඳහා වූ අත්තිකාරම්හි රුපියල් දශලක්ෂ 37·1 ක වැඩිවීමෙන් රුපියල් දශලක්ෂ 30·1 ක්ම රාජ්‍ය සංස්ථාවන් මගින් ලබාගත් අතර, පෞද්ගලික අංශය සඳහා ඉතිරිවූයේ, රුපියල් දශලක්ෂ 7·0 ප්‍රමාණයක් පමණි. කර්මාන්ත අනුව, අත්තිකාරම්හි වූ විශාලම වැඩිවීම 'අනෙකුත් කර්මාන්ත' (රු. ද. 80·0 ) සඳහා වෙන්වූ අතර, ඉංජිනේරු සහ ගොඩනැගිලි වෙළඳාම් සඳහා ( රු. ද. 12 5 ) විය. රසායනික නිෂ්පාදනයන් සඳහා වූ අත්තිකාරම් තුළ රුපියල් දශලක්ෂ 35·2 ක විශාලම අඩුවීමක් පෙන්නුම් කෙරිණි. මේ අතර රෙදිපිළි කර්මාන්තයන්ට වූ අත්තිකාරම් ද රුපියල් දශලක්ෂ 20·7 කින් සැලකියයුතු ලෙස අඩුවිය. කාර්මික ණය ගනුවන්ගෙන් අනිකුත් ශීර්ෂයන්ට වූ අත්තිකාරම්හි වෙනස්වීම් එතරම් සැලකියයුතු නොවන තරම් ය. 1971 වර්ෂයේ සෑම කාර්තුවක්ම අවසානයේදී, කාර්මික අරමුණු සඳහා දෙන ලද අත්තිකාරම් වලින් නොපියවා ඇති ප්‍රමාණයන් පිළිබඳ සවිස්තර වර්ගීකරණයක් 11 (ඇ) 12 සංඛ්‍යා සටහනින් දක්වා තිබේ.

වර්ෂය මුළුල්ලේ කෘෂිකාර්මික අරමුණු සඳහා වූ අත්තිකාරම් රුපියල් දශලක්ෂ 23.7 කින් වැඩිවූ නමුද, මුළු අත්තිකාරම්වල වූ ඒවායේ කොටස් අනුපාතය 1970 අවසානයේදී සියයට 13.1 සිට 1971 අවසානයේදී සියයට 12 9 දක්වා අඩුවුණි. 1970 වර්ෂයේදී කෘෂිකාර්මික අරමුණු සඳහා වූ අත්තිකාරම්හි වැඩිවීම රුපියල් දශලක්ෂ 26·4 ක් විය. එම වර්ෂයේ දී කෘෂිකාර්මික අත්තිකාරම්හි වැඩිවීමෙන් භාගයකටත් වඩා වැඩි ප්‍රමාණයක් ප්‍රධාන අපනයන භෝගයන් සඳහා දෙන ලදී. එහෙත් 1971 වර්ෂයේදී මෙම භෝගයන් සඳහා වූ අත්තිකාරම්හි වැඩිවීම රුපියල් දශලක්ෂ 2·6 ක් පමණ වූ සුළු ප්‍රමාණයක් විය. ඉකුත් වර්ෂය සඳහා වූ රුපියල් දශලක්ෂ 4·9 ක් වූ වැඩිවීම සමඟ සසඳන කල්හි 1971 දී වී නිෂ්පාදනය සඳහා වූ අත්තිකාරම්හි වැඩිවීම රුපියල් දශලක්ෂ 17·3 ක් විය. මෙම වර්ෂයේදී පශු සම්පත් හා කිරිපට්ටි පාලනය ඇතුළුව අනෙකුත් කෘෂි භෝගයන් සඳහා වූ අත්තිකාරම් රුපියල් දශලක්ෂ 3 7 කින් වැඩිවිය 1970 දී ඒවා රුපියල් දශලක්ෂ 6·9 කින් වැඩිවී තිබුණි. මුළු අත්තිකාරම් වලින් 1970 අගදී වාණිජ අරමුණු සඳහා වූ අත්තිකාරම් සියයට 41·7 සිට 1971 අගදී සියයට 42 8 දක්වා වැඩි විය නිරපේක්ෂ සංඛ්‍යාවන් අනුව, මෙම අත්තිකාරම් රුපියල් දශලක්ෂ 110·2 කින් හෙවත් මුළු අත්තිකාරම්හි රුපියල් දශලක්ෂ 219 0 ක වැඩිවීමෙන් සියයට 50 කට වඩා සුළු වශයෙන් වැඩිවිය. 1970 දී මෙම අත්තිකාරම් රුපියල් දශලක්ෂ 24·8 කින් අඩුවී තිබුණි. 1970 දී වූ රුපියල් දශලක්ෂ 2·4 ක අඩුවීමකට සාපේක්ෂව 1971 දී දෙන ලද වාණිජ අරමුණු සඳහා වූ අත්තිකාරම් අතුරින් අපනයන වෙළඳාම සඳහා වූ ප්‍රමාණය රුපියල් දශලක්ෂ 32·6 කින් ඉහළ ගියේය. ආනයන වෙළඳාම සඳහා වූ අත්තිකාරම් 1970 දී රුපියල් දශලක්ෂ 48·3 කින් තියුණු ලෙස අඩුවූ අතර, 1971 දී ඒවා රුපියල් දශලක්ෂ 28·8 කින් වැඩිවිය. ඉකුත් වර්ෂයේදී වූ රුපියල් දශලක්ෂ 3·2 ක් වූ අඩුවීමක් හා සසඳන කල්හි 1971 දී තොග හා සිල්ලර වෙළඳාම සඳහා වූ අත්තිකාරම්හි රුපියල් දශලක්ෂ 30·7 ක සැලකියයුතු වැඩිවීමක් වූ බව වාර්තා වේ. අනෙකුත් වාණිජ අත්තිකාරම්, 1970 දී රුපියල් දශලක්ෂ 29·0 කින් වැඩි වූ නමුත්, 1971 දී එහි රුපියල් දශලක්ෂ 18·3 ක සුළු වැඩිවීමක් සටහන් විය.

## II (ඇ) 11 සංඛ්‍යා සටහන

## අරමුණු හා කල්පිරීම් අනුව වර්ග කරන ලද අත්තිකාරම්*

රුපියල් දශ ලක්ෂ

| | කෙටි – කාලීන අවුරුදු 1 ට අඩු | | මැදි – කාලීන අවුරුදු 1–5 දක්වා | | දිගු – කාලීන අවුරුදු 5ට වැඩි | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|
| | (1) | (2) (1), (7) හි % වශයෙන් | (3) | (4) (3), (7) හි % වශයෙන් | (5) | (6) (5), (7) හි % වශයෙන් | (7) | (8) (7), එකතුවෙහි % වශයෙන් |
| **(අ) වාණිජ** | | | | | | | | |
| 1970 දෙසැම්බර් .. | 502.4 | 78.0 | 104.6 | 16.2 | 36.8 | 5.7 | 643.9 | 41.7 |
| 1971 මාර්තු .. | 512.8 | 78.5 | 104.6 | 16.0 | 36.1 | 5.5 | 653.4 | 41.2 |
| 1971 ජූනි .. | 533.7 | 77.5 | 120.9 | 17.6 | 34.1 | 4.9 | 688.7 | 42.6 |
| 1971 සැප්තැම්බර් .. | 572.7 | 79.0 | 119.2 | 16.4 | 33.3 | 4.6 | 725.3 | 43.5 |
| 1971 දෙසැම්බර් .. | 596.8 | 79.1 | 125.8 | 16.7 | 31.5 | 4.2 | 754.1 | 42.8 |
| **(ආ) මූල්‍ය** | | | | | | | | |
| 1970 දෙසැම්බර් .. | 74.8 | 54.5 | 33.3 | 24.2 | 29.2 | 21.3 | 137.3 | 8.9 |
| 1971 මාර්තු .. | 70.0 | 53.4 | 32.9 | 25.1 | 28.2 | 21.5 | 131.1 | 8.3 |
| 1971 ජූනි .. | 73.0 | 55.1 | 32.7 | 24.7 | 26.7 | 20.2 | 132.4 | 8.2 |
| 1971 සැප්තැම්බර් .. | 72.1 | 55.0 | 30.7 | 23.4 | 28.3 | 21.6 | 131.1 | 7.9 |
| 1971 දෙසැම්බර් .. | 67.2 | 54.1 | 30.2 | 24.3 | 26.8 | 21.6 | 124.1 | 7.0 |
| **(ඇ) කෘෂිකාර්මික** | | | | | | | | |
| 1970 දෙසැම්බර් .. | 91.8 | 45.2 | 85.6 | 42.2 | 25.6 | 12.6 | 203.0 | 13.1 |
| 1971 මාර්තු .. | 99.4 | 47.5 | 84.4 | 40.4 | 25.2 | 12.0 | 209.1 | 13.2 |
| 1971 ජූනි .. | 101.4 | 50.5 | 78.2 | 39.0 | 21.0 | 10.5 | 200.7 | 12.4 |
| 1971 සැප්තැම්බර් .. | 104.0 | 52.3 | 74.8 | 37.6 | 20.0 | 10.1 | 198.8 | 11.9 |
| 1971 දෙසැම්බර් .. | 125.8 | 55.5 | 82.6 | 36.4 | 18.3 | 8.1 | 226.7 | 12.9 |
| **(ඈ) කාර්මික** | | | | | | | | |
| 1970 දෙසැම්බර් .. | 197.0 | 47.3 | 151.5 | 36.4 | 67.4 | 16.2 | 416.0 | 26.9 |
| 1971 මාර්තු .. | 200.7 | 47.1 | 162.0 | 38.0 | 63.1 | 14.8 | 425.8 | 26.8 |
| 1971 ජූනි .. | 211.5 | 49.1 | 158.1 | 36.7 | 60.7 | 14.1 | 430.3 | 26.6 |
| 1971 සැප්තැම්බර් .. | 195.5 | 46.4 | 167.9 | 39.9 | 57.7 | 13.7 | 421.0 | 25.2 |
| 1971 දෙසැම්බර් .. | 225.5 | 49.8 | 170.9 | 37.7 | 56.8 | 12.5 | 453.1 | 25.7 |
| **(ඉ) පරිභෝජනය** | | | | | | | | |
| 1970 දෙසැම්බර් .. | 22.1 | 22.3 | 50.9 | 51.4 | 26.1 | 26.3 | 99.1 | 6.4 |
| 1971 මාර්තු .. | 24.8 | 22.4 | 57.9 | 52.3 | 27.8 | 25.1 | 110.6 | 7.0 |
| 1971 ජූනි .. | 25.6 | 22.6 | 62.2 | 54.9 | 25.4 | 22.4 | 113.2 | 7.0 |
| 1971 සැප්තැම්බර් .. | 30.1 | 24.2 | 66.4 | 53.5 | 27.6 | 22.2 | 124.1 | 7.4 |
| 1971 දෙසැම්බර් .. | 35.1 | 25.5 | 72.7 | 52.8 | 29.7 | 21.6 | 137.5 | 7.8 |
| **(ඊ) අනෙකුත් ණය** | | | | | | | | |
| 1970 දෙසැම්බර් .. | 21.4 | 47.7 | 18.2 | 40.5 | 5.3 | 11.8 | 44.9 | 2.9 |
| 1971 මාර්තු .. | 25.3 | 44.9 | 23.7 | 42.0 | 7.4 | 13.1 | 56.4 | 3.5 |
| 1971 ජූනි .. | 22.2 | 43.1 | 24.5 | 47.6 | 4.9 | 9.5 | 51.5 | 3.2 |
| 1971 සැප්තැම්බර් .. | 37.3 | 54.7 | 25.5 | 37.4 | 5.3 | 7.8 | 68.2 | 4.1 |
| 1971 දෙසැම්බර් .. | 28.3 | 41.9 | 34.0 | 50.4 | 5.2 | 7.7 | 67.5 | 3.8 |
| **(උ) එකතුව** | | | | | | | | |
| 1970 දෙසැම්බර් .. | 909.6 | 58.9 | 444.0 | 28.7 | 190.5 | 12.3 | 1544.1 | 100.0 |
| 1971 මාර්තු .. | 933.2 | 58.8 | 465.5 | 29.3 | 187.8 | 11.8 | 1586.5 | 100.0 |
| 1971 ජූනි .. | 967.4 | 59.8 | 476.7 | 29.5 | 172.7 | 10.7 | 1616.8 | 100.0 |
| 1971 සැප්තැම්බර් .. | 1011.7 | 60.6 | 484.6 | 29.0 | 172.3 | 10.3 | 1668.5 | 100.0 |
| 1971 දෙසැම්බර් .. | 1078.7 | 61.2 | 516.2 | 29.3 | 168.3 | 9.5 | 1763.1 | 100.0 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

* අත්තිකාරම් හි ලෝන, අයිරාවන් සහ වට්ටම් කරන ලද බිල්පත් ඇතුළත් වේ. එකතු වෙමින් පවත්නා මුදල් ශීර්ෂ එයට ඇතුළත් නොවේ.

## II (ඈ) 12 සංඛ්‍යා සටහන

## කාර්මික අරමුණු සඳහා වෙළඳ බැංකු අත්තිකාරම්

(කාලච්ඡේදය අවසානයේදී නොපියවා ඇති ප්‍රමාණය)

රුපියල් දශලක්ෂ

| | 1970 දෙසැම්බර් | 1971 මාර්තු | 1971 ජූනි | 1971 සැප්තැම්බර් | 1971 දෙසැම්බර් |
|---|---|---|---|---|---|
| 1. රෙදිපිළි .. | 86·8 | 81·2 | 89·7 | 71·3 | 66·1 |
| රජයේ සමායතන .. | 21·2 | 15·5 | 24·7 | 8·5 | 4·1 |
| අනෙකුත් .. | 65·6 | 65·7 | 65·0 | 62·9 | 62·0 |
| 2. ලෝහ නිෂ්පාදිත .. | 42·5 | 48·1 | 38·9 | 40·9 | 37·3 |
| රජයේ සමායතන .. | 14·7 | 17·7 | 14·5 | 14·6 | 15·2 |
| අනෙකුත් .. | 27·8 | 30·4 | 24·4 | 26·3 | 22·1 |
| 3. රසායන ද්‍රව්‍ය .. | 58·0 | 54·3 | 54·6 | 56·7 | 22·8 |
| රජයේ සමායතන .. | 38·6 | 38·0 | 37·8 | 36·8 | ... |
| අනෙකුත් .. | 19·4 | 16·3 | 16·8 | 19·9 | 22·8 |
| 4. පාවහන් සහ සම්භාණ්ඩ .. | 6·6 | 6·7 | 7·7 | 9·2 | 8·0 |
| රජයේ සමායතන .. | 4·7 | 5·1 | 5·5 | 5·8 | 5·7 |
| අනෙකුත් .. | 1·9 | 1·7 | 2·1 | 3·5 | 2·3 |
| 5. විස්කෝතු සහ රසකැවිලි .. | 6·7 | 7·1 | 4·8 | 4·0 | 4·3 |
| රජයේ සමායතන .. | — | — | — | — | — |
| අනෙකුත් .. | 6·7 | 7·1 | 4·8 | 4·0 | 4·3 |
| 6. තේ, රබර් සහ පොල් සකස් කිරීම | 29·0 | 31·9 | 33·8 | 37·4 | 35·8 |
| රජයේ සමායතන .. | — | — | — | — | — |
| අනෙකුත් .. | 29·0 | 31·9 | 33·8 | 37·4 | 35·8 |
| 7. ඉංජිනේරු හා ගොඩනැගිලි ව්‍යාපාර .. | 50·9 | 61·6 | 60·5 | 60·1 | 63·4 |
| රජයේ සමායතන .. | 12·1 | 22·9 | 23·3 | 23·6 | 23·8 |
| අනෙකුත් .. | 38·8 | 38·7 | 37·2 | 36·5 | 39·6 |
| 8. අනෙකුත් කර්මාන්ත .. | 135·5 | 134·7 | 140·1 | 141·3 | 215·5 |
| රජයේ සමායතන .. | 68·8 | 56·5 | 61·0 | 74·2 | 141·3 |
| අනෙකුත් .. | 66·7 | 78·2 | 79·1 | 67·0 | 74·2 |
| එකතුව .. | 416·0 | 425·8 | 430·3 | 421·0 | 453·1 |
| රජයේ සමායතන .. | 160·1 | 155·7 | 166·9 | 163·5 | 190·2 |
| අනෙකුත් .. | 255·9 | 270·1 | 263·4 | 257·5 | 262·9 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

මූල්‍ය අරමුණු සඳහා වූ අත්තිකාරම 1970 දී රුපියල් දශලක්ෂ 1·3 කින් අඩුවූ අතර, 1971 දී ඒවා රුපියල් දශලක්ෂ 13·2 කින් විශාල ලෙස අඩු විය. මෙම අත්තිකාරම්හි අඩුවූ රුපියල් දශලක්ෂ 13·2 මුළුමනින්ම පාහේ මූල්‍ය ආයතනයන් සඳහා දෙන ලද අත්තිකාරම සම්බන්ධයෙන් විය. මුළු අත්තිකාරම් ප්‍රමාණයෙහි මූල්‍ය අත්තිකාරම් එකතුවෙහි කොටස් අනුපාතය 1970 අවසානයේදී වූ සියයට 8·9 සිට 1971 අවසානයේදී සියයට 7·0 දක්වා අඩුවුණි.

මෑත අතීතයේ වූ අවුරුදු තුළදී පැවති ප්‍රවණතාවන්ට සම්පූර්ණයෙන්ම වෙනස්ව යමින් 1971 වර්ෂයේදී පාරිභෝගික අරමුණු සඳහා වූ අත්තිකාරම් රුපියල් දශලක්ෂ 38·4 කින් වැඩිවී ඇති බව පෙනේ. 1969 සහ 1970 වර්ෂයන්හි දී වූ වැඩිවීම් පිළිවෙලින් රුපියල් දශලක්ෂ 3·5 ක් සහ රුපියල් දශලක්ෂ 0·3 ක් විය. කල්පවත්නා පාරිභෝගික භාණ්ඩ සඳහා වූ ණය මුදල් රුපියල් දශලක්ෂ 18·4 කින්ද, අනිකුත් පෞද්ගලික අවශ්‍යතාවන් සඳහා වූ ණය රුපියල් දශලක්ෂ 20·1 කින්ද වැඩිවිය. 'අනිකුත් ණය මුදල්' යන ශීර්ෂයෙහි ඉතිරි කොටස සඳහා දෙන ලද ණය ප්‍රමාණයන්ද 1971 දී රුපියල් දශලක්ෂ 22·6 කින් සැළකියයුතු ලෙස වැඩිවිය. 1969 සහ 1970 වර්ෂයන්හිදී වූ වැඩිවීම් පිළිවෙලින් රුපියල් දශලක්ෂ 7·9 ක් සහ

සහ රුපියල් දශලක්ෂ 1·5 ක්ද විය. ආර්ථිකයේ නිෂ්පාදන අංශයන් වෙතින් ණය සඳහා වූ ඉල්ලුමේ අඩුවීම හේතුවෙන් මෙම වර්ෂයේදී වෙළඳ බැංකු ඒවායේ පරිභෝජන සහ අනිකුත් ණයවල රුපියල් දශලක්ෂ 61·0 ක පෙර නොවූ විරූ වැඩිවීමක් විය.

අත්තිකාරම් කල්පිරීම් අනුව බලන විට, මුළු අත්තිකාරම් සඳහා වූ වෙළඳ බැංකු දිගුකාලීන අත්තිකාරම් 1970 අවසානයේදී සියයට 12·3 ක සිට 1971 අවසානයේදී සියයට 9·5 ක් දක්වා සැහෙන ප්‍රමාණයකින් අඩුවිය. කෙටි හා මැදි කාලීන අත්තිකාරම් පිළිවෙලින් සියයට 58·9 සහ සියයට 28·7 සිට සියයට 61·2 සහ සියයට 29·3 දක්වා වැඩි විය 1971 දෙසැම්බර් අවසානයේදි පැවති රුපියල් දශලක්ෂ 684·5 ක් වූ මැදි හා දිගු කාලීන අත්තිකාරම් වලින් නොපියවා පැවති ශේෂයෙන් සියයට 33·3 ක් වූ විශාලතම කොටසකට හිමිකම් පෑවේ කාර්මික අංශයයි. ඊට පසු පිළිවෙලින් වාණිජ අංශය (සියයට 23·0), පරිභෝජන අංශය (සියයට 15·0 ), කෘෂිකාර්මික අංශය (සියයට 14·7), මූල්‍ය අංශය (සියයට 8·3) සහ 'අනිකුත් ණය' අංශය (සියයට 5·7) ආදී වශයෙන් විය.

බැංකු අත්තිකාරම්, ඒ ඒ පොළී ප්‍රමාණයන් යටතේ බෙද දැක්වීමක් II (ඈ) 13 සංඛ්‍යා සටහනින් දැක්වෙයි. අත්තිකාරම්වලින් වැඩිම ප්‍රමාණයක් සියයට 9 පොළිය යටතේ දීම තවදුරටත් එසේම පැවතිණි. කෙසේ වුවද මෙම වර්ෂය තුළදී සියයට 7 ත් සියයට 9 ත් අතර වූ අනුපාතිකය යටතේ වූ අත්තිකාරම්වල සාපේක්ෂ වැඩි බරක් දැකිය හැකිවී. මුළු අත්තිකාරම් වලින් සියයට 9 ට වැඩි පොළිය යටතේ දෙන ලද අත්තිකාරම් අනුපාතය 1970 දෙසැම්බර් අවසානයේදී සියයට 16·1 සිට 1971 දෙසැම්බර් අවසානයේ දී සියයට 19·3 දක්වා ඉහළ ගියේය. එම වැඩිවීම, සමහරවිට මෙම වර්ෂය තුළදී පරිභෝජන හා අනිකුත් ණය වැඩිවීම පිළිබිඹු කරන්නකැයි කිව හැක. සියයට 7 ට වඩා අඩු අනුපාතයක් යටතේ දෙන ලද අත්තිකාරම් අනුරූප කාලය තුළදී සියයට 9·6 සිට සියයට 5·4 දක්වා අඩුවිය.

## II (ඈ) 13 සංඛ්‍යා සටහන

### පොළී අනුපාතිකය අනුව අත්තිකාරම්*

| පොළී අනුපාතිකය සියයට | 1970 දෙසැම්බර් 31 වැනි දින | | 1971 මාර්තු 31 වැනි දින | | 1971 ජූනි 30 ɛැනි දින | | 1971 සැප්තැම්බර් 30 වැනි දින | | 1971 දෙසැම්බර් 31 වැනි දින | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ | එකතු වෙහි % ගණන | ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ | එකතු වෙහි % ගණන | ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ | එකතු වෙහි % ගණන | ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ | එකතු වෙහි % ගණන | ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ | එකතුව වෙහි % ගණන |
| 3½ ට අඩු | 2·8 | 0·2 | 7·5 | 0·5 | 8·1 | 0·5 | 5·0 | 0·3 | 4·2 | 0·3 |
| 3½ | 3·8 | 0·3 | 4·6 | 0·3 | 4·6 | 0·3 | 2·8 | 0·2 | 1·8 | 0·1 |
| 4 | 3·1 | 0·2 | 0·9 | 0·1 | 1·1 | 0·1 | 1·3 | 0·1 | 1·6 | 0·1 |
| 4½ | 2·0 | 0·1 | 2·1 | 0·1 | 2·1 | 0·1 | 1·9 | 0·1 | 2·2 | 0·1 |
| 5 | 26·8 | 1·9 | 36·0 | 2·4 | 36·5 | 2·4 | 30·6 | 2·0 | 42·6 | 2·6 |
| 5½ | 3·1 | 0·2 | 4·0 | 0·3 | 4·2 | 0·3 | 2·6 | 0·2 | 2·4 | 0·1 |
| 6 | 51·0 | 3·5 | 45·8 | 3·1 | 34·7 | 2·3 | 30·0 | 1·9 | 30·9 | 1·9 |
| 6½ | 46·4 | 3·2 | 41·6 | 2·8 | 45·5 | 3·0 | 39·8 | 2·6 | 36·8 | 2·2 |
| 7 | 231·2 | 16·1 | 254·6 | 17·2 | 260·0 | 17·1 | 274·2 | 17·7 | 275·4 | 16·7 |
| 7½ | 140·4 | 9·8 | 116·2 | 7·8 | 146·1 | 9·6 | 135·8 | 8·8 | 148·2 | 9·0 |
| 8 | 166·9 | 11·6 | 181·2 | 12·2 | 162·2 | 10·7 | 181·6 | 11·7 | 187·3 | 11·4 |
| 8½ | 254·7 | 17·7 | 246·5 | 16·6 | 262·4 | 17·3 | 269·5 | 17·4 | 279·8 | 17·0 |
| 9 | 274·9 | 19·1 | 282·1 | 19·0 | 277·2 | 18·2 | 263·8 | 17·0 | 316·7 | 19·2 |
| 9½ | 52·0 | 3·6 | 67·2 | 4·5 | 77·1 | 5·1 | 93·9 | 6·1 | 91·8 | 5·6 |
| 10 | 85·6 | 5·9 | 93·9 | 6·3 | 101·1 | 6·6 | 102·0 | 6·6 | 99·8 | 6·1 |
| 10½ | 7·8 | 0·5 | 9·2 | 0·6 | 8·6 | 0·6 | 12·4 | 0·8 | 12·9 | 0·8 |
| 11 | 37·1 | 2·6 | 35·4 | 2·4 | 35·9 | 2·4 | 37·1 | 2·4 | 36·0 | 2·2 |
| 11½ | 6·5 | 0·5 | 0·5 | ... | 0·4 | ... | 0·6 | ... | 0·9 | ... |
| 12% හා ඊට වැඩි | 42·7 | 3·0 | 52·6 | 3·5 | 52·4 | 3·4 | 62·4 | 4·0 | 76·6 | 4·6 |
| එකතුව | 1438·9 | 100·0 | 1482·1 | 100·0 | 1520·2 | 100·0 | 1547·5 | 100·0 | 1647·9 | 100·0 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

* පවත්නා විනිමය අනුපාතිකයන් අනුව මිළට ගත් බිල්පත් හා එකතුකෙරිගෙන යන මුදල් ශීර්ෂ අයත් නොවේ.

ඇප වර්ගයන් යටතේ බැංකු අත්තිකාරම් වර්ග කොට II (ඇ) 14 සංඛ්‍යා සටහනින් දක්වා ඇත. මෙහිදී ඉතාමත්ම කැපී පෙනෙන ලක්ෂණය වූයේ, පොරොන්දු නෝට්ටු, පිළිනපත් සහ භාවිතිය නෝට්ටු ඇපකොට ගෙන දෙන ලද අත්තිකාරම් රුපියල් දශලක්ෂ 71.9 කින් විශාල ලෙස වැඩි වීමයි. මුළු අත්තිකාරම් සඳහා වූ ඒවායේ අනුපාතය සියයට 13·3 සිට සියයට 15·8 දක්වා ඉහළ ගියේය. මෙම තත්ත්වයද වර්ෂය තුළදී පරිභෝජන සහ අනකුත් ණය සැළකියයුතු අන්දමින් වැඩිවීම පෙන්නුම් කරන්නක් හැටියට විස්තර කළ හැක. වෙළෙඳ තොග සහ ඇප කරුවන් මත දෙන ලද අත්තිකාරම්ද පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 71·9 කින් සහ රුපියල් දශලක්ෂ 62·6 කින් විශාල ලෙස වැඩිවුණි. මුළු අත්තිකාරම් සඳහා වූ ඒවායේ කොටස පිළිවෙලින් සියයට 18·7 සහ සියයට 19·0 සිට සියයට 20·5 සහ සියයට 20·2 දක්වා වැඩිවිය. භාරකාර කුවිතාන්සි සහ බද්ධ ව්‍යාපාර වස්තු සමාගම් කොටස් යටතේ දෙන ලද අත්තිකාරම් සහ මුළු අත්තිකාරම් සඳහා වූ ඒවායේ කොටස් අනුපාතයන් යන දෙකම මෙම වර්ෂය තුළදී අඩුවුණි.

## II (ඇ) 14 සංඛ්‍යා සටහන

### අත්තිකාරම්* ඇප වර්ග අනුව

| | 1970 දෙසැම්බර් 31 වැනි දින | | 1971 මාර්තු 31 වැනි දින | | 1971 ජූනි 30 වැනි දින | | 1971 සැප්තැම්: 30 වැනි දින | | 1971 දෙසැම්බර් 31 වැනි දින | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය රු. දශ ලක්ෂ | එකතු වෙහි % ගණන | ප්‍රමාණය රු. දශ ලක්ෂ | එකතු වෙහි % ගණන | ප්‍රමාණය රු. දශ ලක්ෂ | එකතු වෙහි % ගණන | ප්‍රමාණය රු. දශ ලක්ෂ | එකතු වෙහි % ගණන | ප්‍රමාණය රු. දශ ලක්ෂ | එකතු වෙහි % ගණන |
| ලේඛනගත බිල්පත් .. | 136·1 | 8·8 | 132·2 | 8·3 | 142·3 | 8·8 | 163·3 | 9·8 | 147·1 | 8·3 |
| රජයේ සුරැකුම්පත් .. | 22·9 | 1·5 | 21·1 | 1·3 | 22·7 | 1·4 | 24·0 | 1·4 | 28·8 | 1·6 |
| බද්ධ ව්‍යාපාර වස්තු සමාගම් කොටස් .. | 24·5 | 1·6 | 24·0 | 1·5 | 24·4 | 1·5 | 27·8 | 1·7 | 22·8 | 1·3 |
| කාලීන හා ඉතුරුම් තැන්පතු හා අනෙකුත් මුදල් තැන්පතු (ජීවිත රක්ෂණ ඔප්පුවල මුදල් වටිනාකම ඇතුළුව) .. | 50·1 | 3·2 | 49·9 | 3·1 | 51·3 | 3·2 | 51·3 | 3·1 | 52·8 | 3·0 |
| වෙළෙඳ තොග .. | 289·0 | 18·7 | 301·2 | 19·0 | 307·7 | 19·0 | 351·8 | 21·1 | 361·9 | 20·5 |
| නිශ්චල දේපොළ .. | 196·1 | 12·7 | 187·6 | 11·8 | 198·2 | 12·3 | 190·3 | 11·4 | 201·1 | 11·4 |
| ඇප .. | 293·9 | 19·0 | 320·2 | 20·2 | 335·1 | 20·7 | 338·9 | 20·3 | 356·5 | 20·2 |
| භාර කුවිතාන්සි .. | 118·6 | 7·7 | 112·4 | 7·1 | 108·3 | 6·7 | 93·0 | 5·6 | 106·3 | 6·0 |
| කුලී පිට ගැනුම් ගිවිසුම් .. | 22·3 | 1·4 | 20·9 | 1·3 | 18·3 | 1·1 | 17·1 | 1·0 | 14·5 | 0·8 |
| යන්ත්‍රාගාර හා යන්ත්‍රෝපකරණ .. | 9·0 | 0·6 | 9·9 | 0·6 | 9·2 | 0·6 | 9·8 | 0·6 | 11·6 | 0·7 |
| ට්‍රැක්ටර් හා මෝටර්රථ .. | 59·7 | 3·9 | 61·4 | 3·9 | 61·0 | 3·8 | 59·4 | 3·6 | 67·6 | 3·8 |
| පොරොන්දු නෝට්ටු, පිළිනපත් සහ භාවිතිය නෝට්ටු .. | 206·1 | 13·3 | 230·5 | 14·5 | 221·7 | 13·7 | 230·3 | 13·8 | 278·0 | 15·8 |
| අනෙකුත් ඇප .. | 52·2 | 3·4 | 58·2 | 3·7 | 48·3 | 3·0 | 65·3 | 3·9 | 70·8 | 4·0 |
| ඇප රහිත .. | 63·5 | 4·1 | 57·0 | 3·6 | 68·3 | 4·2 | 46·0 | 2·8 | 43·4 | 2·5 |
| එකතුව .. | 1,544·1 | 100·0 | 1,586·5 | 100·0 | 1,616·8 | 100·0 | 1,668·5 | 100·0 | 1,763·1 | 100·1 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

* එකතු කෙරීගෙන යන මුදල් ශීර්ෂ අයත් නොවේ.

### 3. ඉතුරුම් හා දිගු - කාලීන ණය දෙන ආයතනයන්

රජය මගින් පිහිටුවන ලද ඉතුරුම් සහ ණය දෙන ආයතනයන්ගේ ණයදීමේ ක්‍රියාවලින් පිළිබඳ සංඛ්‍යාවන් II (ඇ) 15 සංඛ්‍යා සටහනින් ඉදිරිපත් කෙරේ.

## II (ඇ) 15 සංඛ්‍යා සටහන

## දිගු කාලීන ණය දෙන ආයතනයන්හි ණය දීමේ කටයුතු

රුපියල් දහස් ගණනින්.

| | 1968 | | 1969 | | 1970 | | 1971 | |
|---|---|---|---|---|---|---|---|---|
| | දෙන ලද ණය ප්‍රමාණය | නොපියවා ඇති ණය ප්‍රමාණය | දෙන ලද ණය ප්‍රමාණය | නොපියවා ඇති ණය ප්‍රමාණය | දෙන ලද ණය ප්‍රමාණය | නොපියවා ඇති ණය ප්‍රමාණය | දෙන ලද ණය ප්‍රමාණය | නොපියවා ඇති ණය ප්‍රමාණය |
| 1. සංවර්ධන මූල්‍ය සමායතනය (අ) .. | 7,273 | 31,716 | 19,561 | 47,982 | 27,082 | 70,920 | 6,439 | 71,422 |
| 2. ලංකා ඉතිරි කිරීමේ බැංකුව .. | 4,386 | 19,943 | 3,671 | 20,921 | 4,563 | 22,803 | 3,082 | 23,517 |
| 3. කෘෂිකාර්මික සහ කාර්මික ණය දෙන සමායතනය . | 3,285 | 30,288 | 4,322 | 31,090 | 4,719 | 31,552 | 3,296 | 31,108 |
| 4. රජයේ උකස් බැංකුව .. | 6,623 | 57,816 | 8,597 | 61,943 | 9,456 | 66,995 | 6,900 | 68,757 |
| 5. ණය මණ්ඩලය .. | 1,076 | 10,758 | 1,212 | 10,920 | 2,459 | 11,858 | 1,926 | 12,570 |
| 6. රජයේ නිවාස දෙපාර්තමේන්තුව (ආ) | 14,355 | 113,960 | 11,663 | 118,867 | 15,056 | 127,386 | 12,370 | 131,667 |
| එකතුව .. | 36,998 | 264,481 | 49,026 | 291,723 | 63,335 | 331,514 | 34,013 | 339,041 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) සාමාන්‍ය කොටස් ආයෝජන ඇතුලත්ය.

(ආ) සංඛ්‍යා තොරතුරු ඔක්තෝබර්/ සැප්තැම්බර් මුදල් වර්ෂයට අදළ වේ. දෙන ලද ණය සංඛ්‍යාවන් ගෙන් දැක්වෙන්නේ, පුද්ගලයින්ට සහ ගොඩනැගිලි සමිතිවලට දුන් ණය මුදල් පමණි. 1968-71 සඳහා නොපියවා ඇති ණය ප්‍රමාණයන්ට ගොඩනැගිලි සමිතිවලට දෙන ලද ණය මුදල් ඇතුළත් නොවේ.

මෙම වර්ෂයේදී ඒ ආයතනයන් මගින් දෙන ලද මුළු ණය ප්‍රමාණයන්හි සැළකියයුතු අඩුවීමක් විය. ඒවා 1970 දී රු. දශලක්ෂ 63·3 සිට 1971 දී රුපියල් දශලක්ෂ 34·0 ක් දක්වා අඩුවී. සංවර්ධන මූල්‍ය සමායතනය මගින් දෙන ලද ණය ප්‍රමාණයන් 1970 දක්වා වූ සෑම වර්ෂයක් පාසාම සීඝ්‍රයෙන් වැඩිවුවද 1971 වර්ෂයේදී රුපියල් දශලක්ෂ 21 කට ආසන්න ප්‍රමාණයකින් විශාල අඩුවීමක් පෙන්නුම් කෙරිණි. 1971 වර්ෂය තුළදී අනෙකුත් ආයතනයන් මගින් දෙන ලද ණය ප්‍රමාණයන්ද ඉකුත් වර්ෂයට වඩා සැළකියයුතු ප්‍රමාණයකින් අඩුවිය. මෙම ආයතනයන්ගේ කටයුතුවල වූ තියුණු අඩුවීම සමහරවිට පෞද්ගලික අංශයේ අසතුටුදායක ආයෝජන වාතාවරණය පෙන්නුම් කරන්නකැයි සිතිය හැක.

1970 සහ 1971 වර්ෂයන්හිදී ඉතුරුම් තැන්පතු සහ ඉතුරුම් සහතිකපත් පිළිබඳ වෙනස්වීම් II (ඇ) 16 සටහන මගින් දක්වෙයි.

## II (ඇ) 16 සංඛ්‍යා සටහන

## ඉතුරුම් තැන්පතු සහ ඉතුරුම් සහතික පත්

රුපියල් දශලක්ෂ

| | 1969 දෙසැම්බර් | 1970 දෙසැම්බර් | 1971 දෙසැම්බර් | 1970/1971 වෙනස |
|---|---|---|---|---|
| තැපැල් කාර්යාලයීය ඉතිරිකිරීමේ බැංකුව .. | 490·5 | 594·4 | 608·8(අ) | + 14·4 |
| ලංකා ඉතිරිකිරීමේ බැංකුව .. | 102·4 | 113·3 | 188·4* | + 75·1* |
| වෙළඳ බැංකු (කාලීන හා ඉතුරුම් තැන්පතු)** .. | 985·6 | 1168·6 | 1317·3 | + 148·7 |
| ඉතුරුම් සහතික පත් .. | 86·3 | 73·1 | 66·0(ආ) | − 7·1 |
| එකතුව .. | 1664·8 | 1949·4 | 2180·5* | + 231·1* |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

** රජයේ තැන්පතු ඇතුළත්ය.

* තාවකාලිකය.

(අ) ඔක්තෝබර්හිදී පැවති සංඛ්‍යාවය.

(ආ) නොවැම්බර්හිදී පැවති සංඛ්‍යාවය.

ඉකුත් වර්ෂයේ වූ රුපියල් දශලක්ෂ 106·8 හා සසඳන කල්හි 1971 වර්ෂයේදී සේවක අර්ථසාධක අරමුදල මගින් ලත් මුළු දයකවීම් රුපියල් දශලක්ෂ 162·6 ක ප්‍රමාණයක් විය.

## 4. කුලිපිට ගැනීමේ මූල්‍ය සමාගම්.

ලංකාවේ කුලිපිට ගැනුම් මූල්‍ය සමාගම්හි ක්‍රියාකාරීත්වයන් හා සම්බන්ධිතව මහ බැංකුව මගින් පවත්වන ලද ත්‍රෛමාසික සමීක්ෂණයේ ප්‍රතිඵලයන්, 1970 වාර්ෂික වාර්තාව මගින් ප්‍රථම වරට ඉදිරිපත් කරනු ලැබීය. එහිදීත් පෙන්වා දුන් අයුරු විශේෂයෙන්ම කුඩා සමාගම් මගින් සමීක්ෂණය කෙරේ දක්වන සංවේදිතාව එතරම් සතුටුදායක එකක් නොවන නිසා සමීක්ෂණ ප්‍රකාශණයන් තුළින් ලබාගන්නා ප්‍රතිඵලයන් පර්යේෂණාත්මක ඒවා වෙයි. සමීක්ෂණය මගින් පෙන්නුම් කරනු ලබන පරිදි, 1970 ජුනි මාසයෙන් ඇරඹී 1971 ජුනි දක්වා ඇති සෑම කාර්තුවක් අවසානයටම කුලිපිට ගැනුම් සමාගම්හි ක්‍රියාකාරීත්වයන් සම්බන්ධයෙන් වූ මූලික ලක්ෂණයන් II (ඇ) 17 සහ 18 සංඛ්‍යා සටහන් මගින් ඉදිරිපත් කෙරේ.

## II (ඇ) 17 සංඛ්‍යා සටහන

## කුලී පිට ගැනුම් මූල්‍ය සමාගම්හි කටයුතු

රුපියල් දශ ලක්ෂ

| | 1970 ජුනි 30 ද වනවිට | 1970 සැප්තැම්බර් 30 වැනිද වනවිට | 1970 දෙසැම්බර් 31 වැනිද වනවිට | 1971 මාර්තු 31 වනද වනවිට | 1971 ජුනි 30 වැනිද වනවිට |
|---|---|---|---|---|---|
| 1. තැන්පතු .. | 58·8 | 74·0 | 75·2 | 75·3 | 70 8 |
| 2. නොපියවා ඇති කුලී පිට ගැනුම් ව්‍යාපාර කටයුතු .. | 84·4 | 106·4 | 99·0 | 96·0 | 81·6 |
| 3. නොපියවා ඇති ණය .. | 19·4 | 19·0 | 19·7 | 19·2 | 18·8 |

## II (ඇ) 18 සංඛ්‍යා සටහන

## කුලී පිට ගැණුම් මූල්‍ය සමාගම් – මුදල් මූලාශ්‍රයන්

(මුළු වගකීම්වල ප්‍රතිශතයක් වශයෙන්)

| | 1970 ජුනි 30 වනවිට | 1970 සැප්තැම්බර් 30 වනවිට | 1970 දෙසැම්බර් 31 වනවිට | 1971 මාර්තු 31 වනවිට | 1971 ජුනි 30 වනවිට |
|---|---|---|---|---|---|
| ·1 ප්‍රාග්ධන ගිණුම .. | 24·0 | 25·2 | 25·8 | 26·6 | 24·4 |
| 2. තැන්පතු .. | 48·0 | 49·1 | 52·5 | 53·6 | 55·2 |
| 3. ණය ගැනීම .. | 20·8 | 18·3 | 13·9 | 12·1 | 11·9 |
| 4. අනිකුත් වගකීම .. | 7 2 | 7·4 | 7·8 | 7·7 | 8·5 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

කුලීපිට ගැනීමේ සමාගම් වෙත වූ මහජනයා සතු තැන්පතු ශේෂයන් 1970 ජුනි අවසානයේදී රුපියල් දශලක්ෂ 58.8 සිට 1971 මාර්තු අවසානයේදී රුපියල් දශලක්ෂ 75 3 දක්වා වැඩිවිය. එහෙත් ජුනි අවසානයේදී ඒවා රුපියල් දශලක්ෂ 70.8 කට අඩු විය. කෙසේවුවද මෙම සමාගම්හි මූල්‍ය සම්පත් සම්බන්ධයෙන් ප්‍රධාන මූලාශ්‍රය හැටියට මහජනයා සතු තැන්පතු තවදුරටත්, වැඩෙමින් පවතියි. සමාගම්හි මුළු වගකීම් තුළවූ මෙම තැන්පතු කොටස් ප්‍රමාණය 1970 ජුනි අවසානයේදී වූ සියයට 48.0 සිට 1971 ජුනි අවසානයේදී සියයට 55·2 දක්වා වැඩි විය. සමාගම් මගින් ගනු ලැබූ ණය ප්‍රමාණයන් (වැඩිවශයෙන්ම වෙළඳ බැංකු වෙතින්) 1970 ජුනි අවසානයේදී මුළු වගකීම්වලින් සියයට 20.8 හැටියට සටහන් වී තිබුණි. එය 1971 ජුනි අවසානය වනවිට සියයට 11.9 ක් වූ ප්‍රමාණයක් දක්වා අඩුවිය. ලංකා ඉතිරිකිරීමේ බැංකුවේ සහ තැපැල් කන්තෝරු ඉතිරි කිරීමේ බැංකුවේ තැන්පතු පොලී අනුපාතිකයන්ගේ සැළකියයුතු වැඩිවීමක් තුළින් හටගත් 1971 දී තැන්පතු ඇද ගැනීම සඳහා වූ තරඟකාරිත්වය යම්තරමකින් හෝ තියුණු වූවායයි සිතිය හැක. එහි ප්‍රතිඵලයක් වශයෙන් වර්ෂයක් ඉක්මවන තැන්පතු සඳහා, සමහර විශාල සමාගම් මගින් ගෙවන ලද පොලී ප්‍රමාණයන් වාර්ෂිකව සියයට 10-12 සිට සියයට 12-14 දක්වා වැඩිවිය. මේ අතර, කුඩා සමාගම් ඊටත් වඩා ඉහළ පොලී අනුපාතිකයන් ගෙවීම තවදුරටත් සිදුවිය.

මෙම සමාගම්වල කුලීපිට ගැනීමේ ව්‍යාපාර පරිමාව 1970 ජුනි අවසානයේදී රුපියල් දශලක්ෂ 84.4 ක සිට ඊළඟ කාර්තුව අවසානයේදී රුපියල් දශලක්ෂ 106.4 දක්වා තියුණු ලෙස වැඩිවිය. එහෙත් එතැන්සිට 1971 ජුනි අවසානයට වූ රුපියල් දශලක්ෂ 81.6 දක්වා අනුක්‍රමික අඩුවීමකට නැඹුරු විය. කුලීපිට මිලදී ගැනීමේ ව්‍යාපාරික කටයුතු මුළුමනින්ම වාගේ තවදුරටත් පවත්වා ගෙන යන ලද්දේ කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ සහ රථවාහන සම්බන්ධයෙන් මූල්‍ය පහසුකම් සැලසීම පිණිසය. කල්පවත්නා පරිභෝගික භාණ්ඩ හා කාර්මික යන්ත්‍රෝපකරණයන් සඳහා දෙන ලද මූල්‍ය පහසුකම් තවමත් නොවැදගත් මට්ටමක පවතියි. මූල්‍ය හා අනිකුත් ගාස්තු ඇතුළත්ව කුලීපිට ගැනුම්හි පොළී ප්‍රමාණය වාර්ෂිකව සියයට 12 සහ 20 අතර වෙනස් විය. මේවා ඒකීය පොළී ප්‍රමාණයන් වූ හෙයින් ක්‍රියාත්මක පොළී අනුපාතිකයන් මීට වඩා ඉහළ එකක් විය යුතුයි.

මෙම කාලච්ඡේදය තුළදී ණයදීමේ ස්වරූපයෙන් කුලීපිට ගැනුම් සමාගම්හි ව්‍යාපාරික කටයුතුවල සුළු විචලනයන් පෙන්නුම් කෙරිණි. ණයමුදල් සඳහා වූ පොළී අනුපාතිකයන් වාර්ෂිකව සියයට 10 සිට 18 අතර පරතරයක වෙනස්විය.

කුලීපිට මිළදී ගැනුම්සමාගම්හි ක්‍රියාකාරිත්වය සමස්තයක් වශයෙන් ගත්විට, පසුගිය අවුරුදු කිහිපය තුළදී ඒවායේ කටයුතු සැහෙන වේගයකින් ප්‍රසාරණය වූ බවක් පෙන්නුම් කෙරිණි. එහෙත් 1970 තෙවැනි කාර්තුවේ සිට ඒවා නොයෙකුත් බාධාවන්ගෙන් පීඩනයට පත්වූ බව පෙනේ. කෙසේවුවද මෙම තත්ත්වය, මූල්‍ය ක්‍රමයෙහි අනිකුත් ක්‍රියාවලින්හි ප්‍රවණතාවයන් හා එක්වන අතර, මූලික වශයෙන්ම පෞද්ගලික අංශයේ කටයුතු අඩාල වීමද ඊට හේතුවක් ලෙස සැලකිය හැක.

## 5. මහ බැංකු කටයුතු

1971 වර්ෂයේදී, මහ බැංකුවේ වත්කම්/වගකීම් රුපියල් දශලක්ෂ 122·8 කින් හෙවත් සියයට 3·7 කින් වැඩි විය. එය සමන්විත වූයේ ජාත්‍යන්තර සංචිතය රුපියල් දශලක්ෂ 44·2කින් වැඩිවීමත් සහ දේශීය වත්කම් රුපියල් දශලක්ෂ 78·6 කින් වැඩිවීමත් තුළිනි. ජාත්‍යන්තර සංචිතයේ වැඩිවීම, ප්‍රධාන වශයෙන්ම මහබැංකුවේ විදේශීය කාසි සහ ශේෂයන් වැඩිවීම නිසා සිදුවූවකි. රජයට දෙන ලද තාවකාලික අත්තිකාරම් රුපියල් දශලක්ෂ 61·0 කින්ද, වෙළෙඳ බැංකුවලට දෙන ලද අත්තිකාරම් රුපියල් දශලක්ෂ 19·7 කින් සහ අනිකුත් වත්කම් සහ ගිණුම් රුපියල් දශලක්ෂ 17·6 කින්ද වැඩිවීමෙන් හා බැංකුව වෙතැති රජයේ හා රජය ඇපවූ සුරැකුම් පත් දැරීම්හි රුපියල් දශලක්ෂ 19·7 ක අඩුවීමක් තුළින් ඇතිවූ තරමක සමහන්වීමක් මගින් දේශීය වත්කම්වල වූ වැඩිවීම සමන්විත විය. මේ අනුව මහ බැංකුවේ දේශීය වත්කම් වැඩිවීම ප්‍රධාන වශයෙන්ම රජයට දෙන ලද ණය ප්‍රසාරණයවීම නිසා ඇතිවූවකි.

වගකීම් අංශයෙහි, මහ බැංකු විදේශීය වගකීම් රුපියල් දශලක්ෂ 128·1 කින් අඩුවිය. විදේශීය ණය ගැණුම් රුපියල් දශලක්ෂ 77.7 කින් සහ ජාත්‍යන්තර සංවිධානයන්ගේ තැන්පතු රුපියල් දශලක්ෂ 50·4 කින් අඩුවීමෙන් එය සමන්විත විය. අනික් අතට බැංකුවේ දේශීය වගකීම් තුළ රුපියල් දශලක්ෂ 250·9 ක සීඝ්‍ර වැඩිවීමක් දක්නට තිබුණි. එය ප්‍රධාන වශයෙන් මුදල් නිකුතුවේ වූ රුපියල් දශලක්ෂ 194·7 ක වැඩිවීමක් සහ 'අනෙකුත් වගකීම් හා ගිණුම්හි' වූ රුපියල් දශලක්ෂ 106·3 ක වැඩිවීමක් හේතු කොට ගෙන ඇති විය. රජය, රාජ්‍ය නියෝජ්‍යත්වයන් හා ආයතනයන් සහ වෙළෙඳ බැංකු තැන්පතු පිළිවෙලින් රුපියල් දශලක්ෂ 37·1 කින්, රුපියල් දශලක්ෂ 5·0 කින් සහ රුපියල් දශලක්ෂ 19·0 කින් අඩු විය. මේ අතර, ප්‍රාග්ධන ගිණුම් රුපියල් දශලක්ෂ 1·0 කින් වැඩි විය.

පසුගිය අවුරුදු දෙක සඳහා වූ වාර්ෂික වාර්තාවන් පෙන්නුම් කරන පරිදි රටතුළ වියමත් මූල්‍ය ප්‍රසාරණයක් ලබාගැනීම සඳහා සකස් කරගත් මිනුමක් හැටියට, මහ බැංකුව ඒවායේ ශුද්ධ දේශීය වත්කම් මත සීමාවක් පවත්වා ගැනීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කරමින් තිබුණි. 1971 දී, මහ බැංකුව සමස්තයක් වශයෙන් මුළු බැංකු ක්‍රමයේම ශුද්ධ දේශීය වත්කම් කිසියම් සීමාවක් තුළ පවත්වා ගැනීමට උනන්දු විය. මෙම අරමුණ සඳහා බැංකු ක්‍රමයේ ශුද්ධ දේශීය වත්කම්, සමන්විත වනුයේ මහ බැංකුවේ විශේෂ ණය සහ රජයට දෙන ලද තාවකාලික අත්තිකාරම්, මහ බැංකුව

වෙතැති රජයේ හා රජය ඇපවූ සුරැකුම් පත් දැරීම් සහ භාණ්ඩාගාර බිල්පත්, එහි 'අනෙකුත් වත්කම් සහ ගිණුම්', වෙළඳ බැංකු සතු එකතුවෙමින් පවත්නා මුදල් ශීර්ෂයන්, ඒවායේ රාජ්‍ය සුරැකුම් පත් දැරීම්, භාණ්ඩාගාර බිල් සහ වාණිජ පත්‍ර (අපනයන බිල්පත් හැර), ඒවායේ ණය සහ අයිරා සහ ඒවායේ ස්ථාවර සහ අනෙකුත් වත්කම් යන කොටස් වලින්, මහ බැංකුව හා වෙළඳ බැංකු වෙතැති රජයේ තැන්පතු, රාජ්‍ය නියෝජ්‍යත්වයන් හා ආයතනයන් සතුව මහ බැංකුව වෙතැති තැන්පතු, මහ බැංකුව වෙතැති 'අනෙකුත් තැන්පතු' සහ මහ බැංකුව හා වෙළඳ බැංකුවල 'අනෙකුත් වග කීම්' යන කොටස් අඩුකරලීමෙනි. මේ අනුව බැංකු ක්‍රමය වෙත වූ ශුද්ධ දේශීය වත් කම් 1970 දෙසැම්බර් අවසානයේදී රුපියල් දශලක්ෂ 3945·5 ක්ව තිබී 1971 දෙසැම්බර් අවසානයේදී රුපියල් දශලක්ෂ 4149.4 දක්වා වැඩිවිය.

වෙළඳ බැංකුවල ශුද්ධ දේශීය වත්කම්හි වූ වැඩිවීම සීමාකිරීම අරමුණු කරගත් මිනුමක් හැටියට පසුගිය අවුරුදු කිහිපය තුළදී ක්‍රියාත්මක වෙමින් පැවති බැංකු ණය සීමාවන්, 1971 දීද, අවුරුද්දේ අවසානයේ සිට ක්‍රියාත්මක වන ලෙස පැනවූ යම් සංශෝධනයන් සහිතව එලෙසම බලපැවැත්විණි. මෙම සංශෝධනයන්ගෙන් නව පදනම් දිනයක් ඇතිවූ අතර ණය සීමාවන්ට අදාළ බැංකු ණය ශීර්ෂයන් තුළට කර්මාන්ත සහ කෘෂිකර්මාන්තයනට (මේවා මෙතෙක් ණය සීමාවන්ගෙන් පරිබාහිර විය) දෙන මැදි හා දිගුකාලීන ණය මුදල්ද ඇතුළත් කෙරිණි. නව සීමාවන්, රාජ්‍ය සමායතනයන් සඳහා රුපියල් දශලක්ෂ 357 ක් සහ පෞද්ගලික අංශයේ අනෙකුත් කොටස් සඳහා රුපියල් දශලක්ෂ 1218 ක් විය. 1970 සහ 1971 දෙසැම්බර් මාසාවසානයට නොපියවා ඇති ණය ප්‍රමාණයන් II (ඇ) 19 වැනි සටහන මගින් පෙන්නුම් කෙරේ.

## II (ඇ) 19 සංඛ්‍යා සටහන

### පෞද්ගලික අංශයට දෙන ලද වෙළඳ බැංකු ණය

(මාසාවසානයෙහි පැවති සංඛ්‍යාවන්)

රුපියල් දශ ලක්ෂ

| | 1970 දෙසැම්බර් | 1971 දෙසැම්බර් |
|---|---|---|
| (අ) සීමාකරයට අදාල ණය | | |
| i රජයේ සමායතන .. .. | 220·0 | 359·2 |
| 1. එකතුකෙරීගෙන යන මුදල් ශීර්ෂ .. .. | 4·5 | 3·9 |
| 2. ආනයන බිල්පත් .. .. | 9·1 | 17·1 |
| 3. ණය .. .. | 105·5 | 85·4 |
| (අ) කාර්මික හා කෘෂිකාර්මික අංශ කෙරේ මැදිකාලීන හා දිගුකාලීන ණය * .. .. | — | 83·1 |
| 4. අයිරා .. .. | 100·8 | 169·7 |
| ii අනෙකුත් පෞද්ගලික අංශය .. .. | 929·6 | 1,168·9 |
| 1. එකතුකෙරීගෙන යන මුදල් ශීර්ෂ .. .. | 13·8 | 19·4 |
| 2. ආනයන බිල්පත් .. .. | 27·8 | 16·2 |
| 3. ණය .. .. | 400·1 | 447·2 |
| (අ) කාර්මික හා කෘෂිකාර්මික අංශ කෙරේ මැදි කාලීන හා දිගු කාලීන ණය* .. .. | — | 134·1 |
| 4. අයිරා .. .. | 487·9 | 551·9 |
| සීමාකරය යටතේ මුළු ණය .. .. | 1,149·6 | 1,528·1 |
| (ආ) සීමාකරයෙන් පරි බාහිර වූ ණය | | |
| i රජයේ සමායතන .. .. | 77·0 | — |
| 1. කෘෂිකාර්මික හා කාර්මික අංශ කෙරේ මැදි කාලීන හා දිගු කාලීන ණය * .. .. | 77·0 | — |
| ii අනෙකුත් පෞද්ගලික අංශය .. .. | 491·1 | 341·8 |
| 1. අපනයන බිල්පත් .. .. | 106·5 | 115·5 |
| 2. කෘෂිකාර්මික ණය ක්‍රමය යටතේ ණය .. .. | 79·2 | 101·8 |
| 3. බඩු තොග කුවිතාන්සි ණය .. .. | 153·1 | 84·9 |
| 4. සමුපකාර ආයතන වලට දුන් අලෙවි අත්තිකාරම් .. | 2·3 | 7·6 |
| 5. තේ කර්මාන්ත ශාලා නවීකරය .. .. | 26·2 | 32·0 |
| 6. කර්මාන්ත හා කෘෂිකර්මාන්ත සඳහා දුන් මැදි සහ දිගු කාලීන ණය * .. .. | 123.8 | — |
| සීමාකරයෙන් පරිබාහිර වූ මුළු ණය ප්‍රමාණය.. .. | 568·1 | 341·8 |
| (ඇ) පෞද්ගලික අංශයට දුන් මුළු ණය ප්‍රමාණය .. | 1,717·7 | 1,870·1 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

* සීමාකරයෙන් පරිබාහිරව තිබූ, කාර්මික හා කෘෂිකාර්මික අංශ කෙරේ වූ මැදි හා දිගු කාලීන ණය 1971 නොවැම්බර් මස සිට සීමාකරයට යටත් කරණ ලදී.

1971 අවසානයේදී පැවති ණය සීමාවන් යටතේ එන ශීර්ෂයන් තුළින් මැදි හා දිගු කාලීන ණය ඉවත්කොට ඇත. එසේ ඉවත්කොට ඇත්තේ සංසන්දනාත්මක පදනමක් යටතේ විශ්ලේෂණය ගෙනයාම අරමුණ කොට ගෙනය. ඒ අනුව, 1971 දී සීමාව යටතේ තිබූ මුළු, ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 161·3 කින් වැඩිවූ අතර සීමාවෙන් පරිබාහිර මුළු ණය (1971 අවසානයේදී මැදි හා දිගු කාලීන ණය මුදල් ඇතුළත්ව) රුපියල් දශලක්ෂ 9·1 කින් අඩුවුණි. ඉකුත් වර්ෂයේදී සීමාව යටතේ වූ ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 85·0 කින් අඩුවූ අතර සීමාවෙන් පරිබාහිර වූ ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 252·8 කින් ඉහළ ගොස් තිබුණි. 1971 දී සීමාවෙන් පරිබාහිර ණය ප්‍රමාණය අඩුවීම කෙරෙහි බඩු තොග කුවිතාන්සි අත්තිකාරම් තියුණු ලෙස අඩුවීම හේතුවූයේ ඒවා 1970 දී එවැනි ණය වැඩිවීමෙන් විශාල කොටසක් සඳහා හේතු සාධක විය.

1971 වසරේදී මහ බැංකුව මගින් මැදි හා දිගු කාලීන ණය අරමුදලින් දෙන ලද ප්‍රතිමූල්‍ය ණය රුපියල් දශලක්ෂ 18·0 ක් විය. එය ඉකුත් වසරේදී රුපියල් දශලක්ෂ 22·3 කි. මෙවර ඇතිවූ වැඩිවීමෙන් රුපියල් දශලක්ෂ 15·3 ක් තේ කර්මාන්තශාලා නවීකරණ යෝජනා ක්‍රමය යටතේ දෙන ලදී. මෙම ප්‍රමාණයෙහි ඇතුළත් විදේශ විනිමය කොටස යොදවන ලද්දේ ආසියානු සංවර්ධන බැංකුව මගිනි. එයින් රුපියල් දශලක්ෂ 13·7 ක් වෙළඳ බැංකු මගින්ද, රුපියල් දශලක්ෂ 1·7 ක් අනෙකුත් ණය දෙන ආයතනයන් මගින්ද ප්‍රයෝජනයට ගන්නා ලදී. කාර්මික හා කෘෂිකාර්මික අරමුණු සඳහා දෙන ලද ප්‍රතිමූල්‍ය ණය රුපියල් දශලක්ෂ 2·6 ක් විය. එයින් රුපියල් දශලක්ෂ 1·2 ක් සංවර්ධන මූල්‍ය සමායතනය මගින්ද, රුපියල් දශලක්ෂ 1·0 ක් වෙළඳ බැංකු මගින්ද රුපියල් දශලක්ෂ 0·4 ක් රාජ්‍ය උකස් බැංකුව මගින්ද ලබාගන්නා ලදී.

1971 දී. රුපියල් දශලක්ෂ 27·1 ක ණය ප්‍රමාණයක් මැදි හා දිගු කාලීන ණය අරමුදලට එකතු කෙරිණි. ඒවායින් රුපියල් දශලක්ෂ 15·0 ක්ම මහ බැංකුවේ සාමාන්‍ය සංචිතයෙන් මාරු කළ අතර කලින් දෙනු ලැබූ ණය මුදල් වලින් ආපසු ගෙවන ලද ප්‍රමාණය රුපියල් දශලක්ෂ 12·1 ක් විය. 1971 දෙසැම්බර් අවසානයට අරමුදලෙහි වූ ශේෂය රුපියල් දශලක්ෂ 14·4 කි. අරමුදල ආරම්භයේ පටන් දෙනු ලැබූ මුළු ප්‍රතිමූල්‍ය ණය වලින් 1971 දෙසැම්බර් අවසානයේ නොපියවා ඉතිරිව ඇති ප්‍රමාණය රුපියල් දශලක්ෂ 60·7 කි.

## 6. බැංකු සංවර්ධනය

ජාතික ඉතිරිකිරීමේ බැංකුව 1971 අගෝස්තු මාසයේදී පිහිටුවනු ලැබීය. ජාතික සංවර්ධන බැංකුව පිහිටුවීම සඳහා ඉදිරිපත් කොට ඇති කෙටුම්පත් පණතක් ළඟදීම නිශ්චිත වශයෙන් ප්‍රකාශයට පත්කෙරෙනු ඇතැයි අපේක්ෂිතය. කෘෂිකාර්මික සංවර්ධන බැංකුව පිහිටුවීම සඳහා මුදල් අමාත්‍යාංශය මගින් සකස්කොට ඇති කෙටුම්පත් පණත මහ බැංකුවේ පරීක්ෂණයට භාජනය වෙමින් පවතියි. මුදල් අමාත්‍යාංශයේ යෝජනාවක් අනුව පිහිටුවන්නට යන ආනයන–අපනයන බැංකුව සම්බන්ධයෙන් අවශ්‍ය ව්‍යවස්ථා සම්පාදන කටයුතු මහ බැංකුවද නියෝජනය කරන කමිටුවක් මගින් සකස්කර ගෙන යයි.

මහ බැංකුව මගින් යෝජනා කරන ලද අදහස් යටතේ තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයක් ඇති කරලීම සඳහා මුදල් නීති සංග්‍රහය සංශෝධනය කරනුවස් ව්‍යවස්ථාපිත කෙටුම් පත විමර්ශනයට භාජනය වෙමින් පවතී.

ආර්ථික කටයුතු සඳහා මුදල් යෙදීමේදී වඩා පුළුල් වූත්, එමෙන්ම ඵලදායී වූත් ක්‍රියාවලියක් අනුගමනය කිරීමට ලංකා බැංකුවටත් මහජන බැංකුවටත් හැකිවන අයුරින් එම බැංකු දෙකෙහි ආඥා පණත් පිළිබඳ යෝජිත සංශෝධනයන් රජය මගින් අනුමත කොට තිබේ. මේ සඳහා අවශ්‍ය ව්‍යවස්ථාවන් නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කෙරෙමින් පවතී.

ලංකාවේ කුලීපිට ගැනීමේ සහ මූල්‍ය සමාගම්වල කටයුතු පාලනය කිරීම සඳහාද කෙටුම් පත් පණතක් සකස්කොට ඇති අතර, එය දැනට මහ බැංකුවේ විමසුමට ලක් වෙමින් පවතී.

බැංකු සහ අනිකුත් මූල්‍ය ආයතනයන් මගින් දෙනු ලබන ණය සඳහා ඇප හැටියට තබන නිශ්චල දේපළ සම්බන්ධයෙන් අයිතියෙහි පවත්නා අඩුපාඩු මකාලන රක්ෂණ ක්‍රමයක්ද ලංකා රක්ෂණ සංස්ථාව මගින් හඳුන්වා දෙන ලදී.

---

1 බැංකුව එහි ව්‍යාපාර කටයුතු 1972 මාර්තු මස 16 වෙනි දින ආරම්භ කළේය.